කාර්ය සාධන වාර්තාව - 2021



සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා

ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

(වැය ශීර්ෂ අංකය - 414)

පටුන

අන්තර්ගතය	පිටු අංක
පරිච්ඡේදය 01 – ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01 - 15
පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම	16 - 39
පරිච්ඡේදය 03 – වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	40 - 64
පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක	65 - 66
පරිච්ඡේදය 05 – තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	67 – 70
පරිච්ඡේදය 06 – මානව සම්පත් පැතිකඩ	71 - 73
පරිච්ඡේදය 07 – අනුකූලතා වාර්තාව	74 - 82

පරිච්ඡේදය 01 – ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 ආයතනයේ දැක්ම, මෙහෙවර

දැක්ම

වසර 2030 වන විට දිළිඳුකමින් හා කුසගින්නෙන් තොර ශ්‍රී ලංකාවක්

මෙහෙවර

වැඩිදියුණු කළ සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග, ජීවනෝපාය ආධාර, ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම්, රැකියා අවස්ථා, රැකියා අභිමුඛ දැනුම සහ වෘත්තීය පුහුණුව සැපයීම මගින් අවධානමට ලක් වූ ප්‍රජාව සවිබලගැන්වීම

1.2 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2194/74 හා 2020.09.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත විය.

2030 වන විට දිළිඳුකම තුරන් කරමින් සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීමේ දැක්ම පෙරදැරිව ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ඇති කිරීම සඳහා අදාල නීති අණපනත්වලට අනුකූලව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන විෂයන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනයට සහය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාල ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ කාර්ය භාරය වන අතර දෙපාර්තමේන්තු, ආයතන හා අංශ පහත පරිදි වේ.

I. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)
II. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)
III. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB)
IV. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය (NSPD)
V. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)
VI. ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)
VII. ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය (RDTRI)
VIII. උපදේශන අංශය
IX. රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව (SRMC)

ඒ අනුව සමාජයේ ජීවත්වන අවාසි සහගත තත්ත්වයන්හි සිටින පුද්ගලයින් සඳහා හිතකාමී පරිසරයක් හා අවස්ථා උදාකර දීමෙන් ඔවුන්ද සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත්කිරීම සඳහා පහත ප්‍රධාන ඉලක්කගත කණ්ඩායම් සඳහා සේවා සපයයි.

- අඩු ආදායම්ලාභී පවුල්
- ආබාධ සහිත පුද්ගලයින්
- තනිමාපිය පවුල්

මෙම ප්‍රධාන ඉලක්කගත කණ්ඩායම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් පසුගිය වසර තුල ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන් හරහා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ දරිද්‍රතාවය අවම කරමින් සෞභාග්‍යමත් ජාතියක් ගොඩනැංවීමට මෙම අමාත්‍යාංශය මඟින් මහඟු දායකත්වයක් ලබාදී ඇත.

ඒ අනුව, අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වැය ශීර්ෂ අංක 414 යටතේ ක්‍රියාත්මක වන අතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 331 යටතේ ක්‍රියාත්මක වේ.

1.3 ප්‍රධාන කාර්යයන් හා සුවිශේෂී ප්‍රමුඛතා

(2020.09.25 අංක 2194/ 74 දරණ ගැසට් පත්‍රය අනුව)

කාර්යයන් හා කර්තව්‍යයන්

මුදල් අමාත්‍යවරයාගේ උපදෙස් හා මඟපෙන්වීම මත ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ඇති කිරීම සඳහා අදාල නීති අණපනත්වලට අනුකූලව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන විෂයන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනයට සහය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාල ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

සුවිශේෂී ප්‍රමුඛතා

- සමෘද්ධිලාභීන් ඉලක්ක කර ගත් ගෘහ ආර්ථික සවිබලගැන්වීම, ප්‍රජා මූල්‍ය වැඩසටහන්, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා සේවා පහසුකම් ශක්තිමත් කිරීම හා ස්වයං රැකියා අවස්ථා පුළුල් කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදනය පුළුල් කිරීම.
- නව ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය දීර්ඝ කාලීන බදු පදනම යටතේ ලබාදෙන ඉඩම්, ණය පහසුකම්, ව්‍යාපාර උපදේශනය, තාක්ෂණික හා යටිතල පහසුකම් ආදී සියල්ලම පහසුවෙන් ලබාදෙන විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා එක් ආයතනයක් මඟින් සියළු සේවා සැපයීමේ ක්‍රමවේදයක් සකස් කිරීම හා එම ක්ෂේත්‍රවල අගය වැඩි කිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් අවශ්‍ය දිරිගැන්වීම් සිදු කිරීම.
- ආබාධ සහිත තැනැත්තන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1.4 සංවිධාන සටහන

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය



අධ්‍ය.ජ.(DSD)- අධ්‍යක්ෂ ජනරාල් (Department of Samurdhi Development)
අධ්‍ය.ජ.(NISD) - අධ්‍යක්ෂ ජනරාල් (National Institute of Social Development)
අති.අධ්‍ය.ජ. (DSD) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (Department of Samurdhi Development)
අති.අධ්‍ය.ජ. (DSD) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (National Institute of Social Development)
ජ්‍යෙ.ස.ලේ - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ස.ලේ. - සහකාර ලේකම්
නි.අධ්‍ය - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අධ්‍ය -සහකාර අධ්‍යක්ෂ
අධ්‍ය.(RDTRI) - අධ්‍යක්ෂ (Rural Development Training and Research Institute)
නි.සා. - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
සං.නි. - සංවර්ධන නිලධාරි

අධ්‍ය (සං) - අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍ය (සැල.) - අධ්‍යක්ෂ (සැලසුම්)
අධ්‍ය (SDB) - අධ්‍යක්ෂ - (Saubhagya Development Bureau)
ප්‍ර.ග. - ප්‍රධාන ගණකාධිකාරී
ප්‍ර.අ.වි. - ප්‍රධාන අභ්‍යන්තර විගණක
අධ්‍ය.(NSPD) -අධ්‍යක්ෂ (National Secretariat for Persons with Disabilities)
අධ්‍ය.(Coun) - අධ්‍යක්ෂ - (Counselling)
ස.සා. - සහකාර සාමාන්‍යාධිකාරී (Rural Developmet Bank)
කළ.සහ. - කලමනාකරණ සහකාර
කා.කා.ස. - කාර්යාල කාර්ය සහායක

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ ආයතන හා අංශ



1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා අංශ

1.6.1 පාලන අංශය

අමාත්‍යාංශයේ පරිපාලන, ආයතන, ප්‍රවාහන හා තොරතුරු තාක්ෂණ කටයුතු මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම, අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතනවල පරිපාලන හා ආයතනික කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය පහත අරමුණු පෙරදැරිව සිදු කරයි.

i. අමාත්‍යාංශයට හා එම අංශයට අයත් සියළුම ආයතනවල කාර්ය මණ්ඩලයට අදාල ආයතනික හා පරිපාලන කටයුතු මෙහෙයවීම.
ii. දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම තුළින් මානව සම්පත් හැකියා සංවර්ධනය කිරීම.
iii. අමාත්‍යාංශයේ විෂය පථයට අදාලව අමාත්‍ය මණ්ඩල සංදේශ,පනත්කෙටුම්පත් ආදිය නිසි පරිදි ඉදිරිපත් කිරීම මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම.
iv. අමාත්‍යාංශයේ කාර්යයන් පවත්වා ගෙන යාමටඅවශ්‍ය මානව සම්පත් හා යටිතල පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.
v. අමාත්‍යාංශයට අයත් සියලුම ආයතන සම්බන්ධීකරණය කිරීම
vi. අමාත්‍යාංශයට අයත් නිලධාරින්ගේ මානව සම්පත් සංවර්ධන කුසලතා සංවර්ධනය කිරීම

අංක 02/2018 හා 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ කේන්ද්‍ර ගත වී පවත්නා මානව සම්පත කාර්යක්ෂමව, ගුණාත්මකව හා සඵලදායි ලෙස රටේ සංවර්ධනය සඳහා ප්‍රාග්ධනයක් ලෙස යොදා ගැනීම සඳහා සැලසුම් සහගත ලෙස සංවර්ධනය කිරීම පිණිස රාජ්‍ය ආයතනවල සේවය කරනු ලබන සමස්ත කාර්ය මණ්ඩලයේ එක් එක් නිලධාරීන් හට පැවරී ඇති විෂයන්වලට අදාළ රාජකාරි නිසි අයුරින් ඉටු කිරීම සඳහා ලබා දිය යුතු පුහුණු වීම් නිසි පරිදි හඳුනාගෙන එම පුහුණුවීම් නියමිත කාලය තුළ ලබා දීමත්, සියළුම නිලධාරීන් වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු වීම් සඳහා අවස්ථාව සැලසීමත් සියලු රාජ්‍ය ආයතන විසින් අනිවාර්යයෙන්ම සැපිරිය යුතු කටයුත්තක් ලෙස දක්වා ඇත.

එම අරමුණු සපුරාලීම පිණිසත්,සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියාහා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනයන්හි දැක්ම, මෙහෙවර හා අරමුණු සාක්ෂාත් කර එහි කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිසත් රාජ්‍ය අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනයන්හි මානව සම්පත වටිනා ප්‍රාග්ධනයක් ලෙස සංවර්ධන කිරීම සඳහා නිලධාරීන්ගේ විෂයානුබද්ධ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය සහ ආධ්‍යාත්මික සංවර්ධනය මත් ඔවුන්ගේ සේවාවන් ඵලදායි, කාර්යක්ෂම හා ගුණාත්මක අන්දමින් යොදා ගැනීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

1.6.2 ගිණුම් අංශය

අමාත්‍යාංශයට අදාලව මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිද භාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මගින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වා ගෙනයාම ගිණුම් අංශය මඟින් ඉටුකරන ප්‍රධාන කාර්යභාරය වේ.

මෙහි ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ සහ ප්‍රධාන ගණකාධිකාරීවරයාගේ මගපෙන්වීම, කළමනාකරණය, අධීක්ෂණය හා මෙහෙයවීම මගින් ගිණුම් කටයුතු සිදුවන අතර මුදල් රෙගුලාසි, විශේෂ විධි විධාන හා රජයේ චක්‍රලේඛ මගින් ලබාදී ඇති බලතල අනුව පහත සඳහන් කාර්යන්ද සිදුකරනු ලබයි.

i. අමාත්‍යාංශයට අයත් සමස්ත වාර්ෂික අයවැය ලේඛනය සකස් කර නියමිත දිනට ප්‍රථම ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.

ii. සියලුම ගණුදෙනු නිවැරදිව හා යාවත්කාලීනව ගිණුම් තැබීම හා ගිණුම් ඉදිරිපත් කිරීම.

iii. මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමට ඉහළ කළමනාකරණය වෙත සහාය වීම.

iv. සියලුම ලැබීම් හා වියදම් අධීක්ෂණය සහ වියදම් පාලනය.

v. වියදම් සමාලෝචනය සඳහා ඉහළ කළමනාකරණය වෙත යෝජනා ඉදිරිපත් කිරීම.

vi. මහා භාණ්ඩාගාර සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණ කටයුතු කිරීම.

vii. සියලුම මිලදී ගැනීම් වලදී විනිවිදභාවයෙන් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් මූල්‍ය නීතිරීති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම හා සහය වීම.

viii. දිවයින පුරාම විහිදී ඇති සහනාධාර ලබන ප්‍රතිලාභීන්ගේ ප්‍රතිලාභ නියමිත දිනට සහ වේලාවට ඔවුන් වෙත ලබාදීම සඳහා සහාය ලබාදීම.

ix. අමාත්‍යාංශය යටතේ පවතින රජයේ වත්කම් යාවත්කාලීන කිරීම, ආදායම් එකතු කිරීම හා සුපරීක්ෂණය.

x. අමාත්‍යාංශයට අයත් ආයතන වල මූල්‍ය හා ගිණුම් කටයුතු නිවැරදිව පවත්වා ගෙන යාමට සහාය වීම.

1.6.3 අභ්‍යන්තර විගණන අංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 වගන්තිවල සඳහන් රාජකාරී හා අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශයෙහි උපදෙස් මෙන්ම 2018 අංක 19 දරණ විගණන පනතේ VII කොටසෙහි 40 වගන්තිය අනුව අමාත්‍යාංශ ලේකම් වෙත සෘජුව වාර්තා කිරීම සඳහා බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා යටතේ ක්‍රියාත්මක වේ.

එමෙන්ම ආයතනයේ අරමුණු කරා ලගාවීමේදී මූල්‍ය සැලසුම්කරණ, අභ්‍යන්තර පාලන පොත්පත් හා ගිණුම් නිසිපරිදි පවත්වාගෙන යාම, මුල්‍ය කළමනාකරණය හා කළමනාකරණ තොරතුරු සැපයීමේ ක්‍රමවේදය සඵලදායී ලෙස සිදුවන බවට සහතික වීම මෙම අංශයේ අරමුණ වේ.

1.6.4 සැලසුම් හා මෙහෙයුම් අංශය

අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, ක්‍රියාත්මක වැඩසටහන් මෙහෙයවීම සහ ප්‍රගති පාලනය සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණ කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාර්ය වේ.

1.6.5 සංවර්ධන අංශ (I, II, III)

සංවර්ධන අංශ 3 ක් ලෙස ක්‍රියාත්මක වන අතර එම ආයතනයන්හි ප්‍රධානියා අතිරේක ලේකම්වරයෙකි. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු , ආයතන හා අංශ මඟින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳව අධීක්ෂණය, මඟපෙන්වීම හා අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කිරීම මෙම අංශයන්හි ප්‍රධාන කාර්යභාර්ය වන අතර පහත පරිදි සංවර්ධන අංශ සඳහා ආයතන බෙදී ගොස් ඇත.

- සංවර්ධන අංශය I - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
- සංවර්ධන අංශය II - අබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව හා ජාතික මහ ලේකම් කාර්යාලය
  ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
  සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය
- සංවර්ධන අංශය III - සමාජ ආරක්ෂණ මණ්ඩලය
  ජාතික සමාජ සංවර්ධන ආයතනය
  ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
  උපදේශන අංශය

1.6.6 සෞභාග්‍ය සංවර්ධන කාර්යාංශය

රට හදන සෞභාග්‍යයේ දැක්ම යථාර්ථයක් බවට පත් කිරීම සඳහා ග්‍රාමීය ජනතාව සෘජුව නිෂ්පාදන කාර්යයට සම්බන්ධ කර ගනිමින් ජාතික නිෂ්පාදනය වැඩි කිරීම පිණිස සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන හඳුන්වාදෙන ලදී. ඒ අනුව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ සෞභාග්‍ය සංවර්ධන කාර්යාංශය ස්ථාපිත කරනු ලැබිනි. එක් එක් ගම්මානයන්හි පවතින සම්පත් සුලභතාවය, නිෂ්පාදන විභවතාව, වෙළඳපොල හා තිරසාරව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පදනම් කරගනිමින්, අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ සේවා සපයන ගම්මාන නිෂ්පාදන ගම්මාන ලෙස සංවර්ධනය කරනු ලබයි.

අරමුණු

i. දේශීය නිෂ්පාදන දිරිමත් කිරීම හා ප්‍රචලිත කිරීම
ii. පවතින සහ විශේෂිත නිෂ්පාදන දිරිමත් කිරීම
iii. රැකියා අවස්ථා උදා කිරීම මඟින් විරැකියාව අඩු කිරීම
iv. ග්‍රාමීය ආර්ථිකය නංවාලීම සඳහා විකල්ප ආදායම් මාර්ග ඇති කිරීම
v. ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම

උපාය මාර්ග

i. එක් නිෂ්පාදනයක් සඳහා යෙදවුම් වන වෙනත් අමුද්‍රව්‍ය, ඇසුරුම් ආදිය වෙනත් ගම්මාන තුළ නිෂ්පාදනය කිරීමට දිරිගැන්වීම
ii. ප්‍රතිලාභීන් සඳහා සෘජුව ලබාදෙන ප්‍රතිලාභ සඳහා 50% හෝ ඊට වැඩියෙන් ප්‍රතිලාභී දායකත්වයක් දැරිය යුතු වීම
iii. ප්‍රතිලාභී දායකත්වය මුදලින් මෙන්ම ප්‍රාග්ධන ස්වරූපයේ වෙනත් යෙදවුම් ලෙසද ලබාදිය හැකිවීම
iv. නිෂ්පාදන ගම්මානයේ සියළුම ප්‍රතිලාභීන් නිෂ්පාදන සමිතියේ සාමාජිකයින් වීම මඟින් එක් නිෂ්පාදන ඒකකයක් ලෙස ක්‍රියාත්මක වීමේ හැකියාව
v. නිෂ්පාදකයින්ට පොදුවේ පරිහරණය කල හැකි උපකරණ හා අනෙකුත් පහසුකම් නිෂ්පාදන සමිතියට ලබා දීම මඟින් වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබා ගැනීමට සැලසීම

1.6.7 උපදේශන අංශය

එවකට කාන්තා අභිවෘද්ධි හා සමාජ සුබසාධන අමාත්‍යාංශය වශයෙන් ක්‍රියාත්මක වූ මෙම අමාත්‍යාංශය යටතේ 2003 වර්ෂයේ දී සමාජ සේවා නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් උපදේශන සේවාව ලබාදීම ආරම්භ කර ඇත.

ඉන්පසු 2004 වර්ෂයේ සිදු වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් මෙම අමාත්‍යාංශය යටතේ උපදේශන අංශය නමින් අංශයක් ස්ථාපිත කර 2005 වර්ෂයේ නව උපාධිධාරීන් බඳවා ගැනීම ජාතික ප්‍රතිපත්තිය අනුව, දෙපාර්තමේන්තු ගත තනතුරක් ලෙස ‘‘උපදේශන සහකාර‘‘ නමින් නිලධාරීන් බඳවා ගනිමින් උපදේශන මැදිහත්කරණ කාර්යය පුළුල් කර ඇත.

ඒ අනුව, වරින් වර විවිධ ප්‍රතිපත්ති යටතේ බඳවාගෙන මේ වනවිට සේවය කරන උපදේශන නිලධාරීන් සංඛ්‍යාව 209 කි. ප්‍රධාන කාර්යාලයටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලටත් අනුයුක්තව උපදේශන සේවා සැපයීම සිදු කරති. එනමුත්, 2019 වර්ෂයේ දී උපදේශන අංශය සඳහා, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් 324 දෙනෙකු බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත. එනමුත් එම ප්‍රමාණය ද වර්තමානයේ පවතින උපදේශන සේවා ඉල්ලුම සහ උපදේශන නිලධාරීන්ගේ ඉල්ලුම අනුව කිසිසේත්ම ප්‍රමාණාත්මක නොවන අතර, එම අනුමත සංඛ්‍යාව තුළ ද තවමත් පුරප්පාඩු පවතී.

ප්‍රජාව මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරුවීම අවම කිරීම, උපදේශන ක්ෂේත්‍රයේ නව්‍යතාවයන් භාවිතා කරමින් ගුණාත්මක උපදේශන සේවාවක් සැපයීම, උපදේශන සේවයේ නියුතු වෘත්තිකයන් අතර විධිමත් සහසම්බන්ධතාවයක් ඇති කිරීම, උපදේශන සේවා ලබාදීම පිළිබඳ අධීක්ෂණය හා මඟපෙන්වීම මෙම අංශයේ අරමුණු වේ. ඒ යටතේ පහත සඳහන් කාර්යන් සිදුකරනු ලබයි.

i. උපදේශන සේවාව සඳහා ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම/ ක්‍රියාත්මක කිරීම/ නියාමනය කිරීම
ii. උපදේශන සේවා සම්බන්ධයෙන් ප්‍රමිතීන් සකස් කිරීම
iii. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් උපදේශන නිලධාරීන් අනුයුක්ත කර උපදේශන සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම
iv. උපදේශන සේවා අවශ්‍යතා ඇති රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලට උපදේශන නිලධාරීන්ගේ සේවය ලබාදීම (රෝහල් - මානසික රෝග සායනය/ ආඝාත රෝග සායනය/ පිළිකා රෝග සායනය/ වකුගඩු රෝග සායනය, බන්ධනාගාර, ළමා හා වැඩිහිටි නිවාස, ගුවන් සේවා සමාගම)

v. උපදේශන සේවයේ සහාය ලබාගැනීමට අත්‍යවශ්‍ය නමුත් කාර්යාල ගත නිලධාරියකු හමුවීමට නොහැකි තත්වයක දී හෝ අවස්ථාවක දී සේවය ලබා ගැනීමට පහසුකම් සැලසීම වෙනුවන් 24 පැය ජංගම දුරකථන උපදේශන සේවාවක් ක්‍රියාත්මක කිරීම

vi. ස්වභාවික හා මිනිසා විසින් ඇති කරන ලද ව්‍යසනයන්ට ගොදුරු වූ ප්‍රජාව සඳහා ව්‍යසන උපදේශන සායන පැවැත්වීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

vii. සංවර්ධනාත්මක හා නිවාරණාත්මක උපදේශන වැඩසටහන් පැවැත්වීම තුළින් උපදේශන සේවාව ප්‍රචලිත කිරීම

viii. උපදේශන සේවාව පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් කුසලතා සංවර්ධනය කිරීම

ix. උපදේශන සේවා සපයන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය කිරීම

x. උපදේශන විෂය ක්ෂේත්‍රය පිළිබඳ න්‍යායාත්මක හා දැනුම ප්‍රවර්ධනය සඳහා මුද්‍රිත ප්‍රකාශන නිකුත් කිරීම (සිංහල හා දෙමළ මාධ්‍ය)

1.6.8 ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය

1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවා ඇත. ඒ අනුව, ආබාධ සහිත තැනැත්තන් සඳහා හිතකර පරිසරයක් උදාකර දීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඇතුළු සහන සැලසීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව පිහිටුවා ඇත.එමෙන්ම ජාතික සභාව මඟින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවා ඇත. එම ආයතනයේ ප්‍රධාන කාර්යයන් වන්නේ

i. ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට, අභිසංවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට වගබලා ගැනීම,

ii. ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ අභිසංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් සඳහා උපදෙස් දීම,

iii. අදාල අමාත්‍යාංශ, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මහලේකම් කාර්යාල, රාජ්‍ය හා පුද්ගලික අංශ සහ සංවිධාන විමසා ආබාධ සහිත තැනැත්තන්ගේ අර්ථ සිද්ධිය හා අයිතිවාසිකම් වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සියළු පියවර ගැනීම.

iv. ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන් ආරක්ෂා කිරීම සඳහා වූ යෝජනා ක්‍රම නිර්දේශ කිරීම,

v. ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ යෝජනා ක්‍රම මූලාරම්භනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම,

vi. ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වූ අදාළ ජාත්‍යන්තර ප්‍රකාශන සහ සම්මුති ආණ්ඩුව විසින් පිළිගනු ලබන බවට සහ අනුගමනය කරනු ලබන බවට වග බලාගැනීම,

vii. ආබාධ සහිත තැනැත්තන් සඳහා වඩා හොඳ ජීවන තත්වයක් ඇති කිරීමට වග බලාගැනීම,

viii. ආබාධ සහිත තැනැත්තන් රැකබලාගැනීම සඳහා පිහිටුවන ලද ආයතනවල කටයුතු සඳහා මහපෙන්වීම, ඒවාට සහායදීම, එම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම,

ix. ආබාධ සහිත තැනැත්තන්ට පිවිසිය හැකිසේ භෞතික පරිසරය සකස් කිරීමේ වැඩපිළිවෙලවල් හඳුන්වාදීම සහ තොරතුරු ලබාගැනීමට සහ සන්නිවේදනයට ප්‍රවේශය, ආබාධ සහිත තැනැත්තන්ට ලබා ගත හැකි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

1.6.9 ජාතික සමාජ සංවර්ධන ආයතනය

1992 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත යටතේ ස්ථාපනය කර ඇති ජාතික සමාජ සංවර්ධන ආයතනයෙහි ආරම්භය 1952 දී ස්වෙච්ඡා සංවිධාන කිහිපයක සහභාගිත්වයෙන් පිහිටුවා ගන්නා ලද "සමාජ වැඩ පිළිබඳ ආයතනයයි". 1964 දී මෙය රජයට පවරා ගනු ලැබීමත් සමඟ "ලංකා සමාජ සේවා විද්‍යාලය" ලෙස නම් කෙරිණි. එයින් පසුව ජාතික සමාජ සංවර්ධන ආයතනය 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ අංක 25A වගන්තිය යටතේ උපාධි පිරිනමන ආයතනයක් බවට පත්විය.
1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ පහත සඳහන් අරමුණු ලගාකර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- වෘත්තිය සමාජ වැඩ අධ්‍යාපනය, සමාජ සුබසාධන කළමනාකරණය හා සමාජ සංවර්ධනය පිළිබඳ උසස් පාඨමාලා පැවැත්වීම, ප්‍රවර්ධනය හා ඒවා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මට්ටමකට ගෙන යාම.
- පුහුණු පාඨමාලා පුළුල් කිරීම, ශක්තිමත් කිරීම, සමාජ සුබසාධනය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ වෙනත් ආයතන සමඟ සහයෝගිත්වයෙන් ඒවා පැවැත්වීම, අඩු වරප්‍රසාද ලාභීන් බල ගැන්වීම, මානව කුසලතා හා වෘත්තීය කුසලතා සංවර්ධනය තුලින් පුද්ගලයන්ට හොඳ ජීවන මට්ටමක් ලබා දීම.
- සමාජ වැඩ අධ්‍යාපනය හා පුහුණුව, සමාජ සුබසාධනය හා සංවර්ධනයට අදාල පර්යේෂණ කටයුතු කිරීම, ප්‍රවර්ධනය හා පවත්වාගෙන යාම තුලින් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ දියුණුව සැලසීම.
- සමාජ සුබසාධනය හා සමාජ සංවර්ධනය සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීමට, සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විශේෂ දායකත්වය සැපයීම.
- ඉහත සියලුම අරමුණු සාර්ථකව ලගා කර ගැනීමට අවශ්‍ය වන මූල්‍යමය අධ්‍යයන හා අනධ්‍යයන මිනිස් බලය හා විශේෂයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයට ස්ථීර ස්ථානයක් ස්ථාපනය කර යටිතල පහසුකම් ඇතුලු අනෙකුත් සම්පත් ලබා ගැනීම.

1.6.10 ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, 1974 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර, වර්තමානය වන විට මෙය සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන හා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙය 1978 වර්ෂයේදී ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම පිටු දැකීමේ ක්‍රමෝපයක් ලෙස, සංවර්ධන ප්‍රවාහයෙන් ආන්තීකරණයට ලක් වූ නැතහොත් කොන් වූ දිළිඳු ප්‍රජාව සතු විභව ශක්තිය මතු කරමින් ඔවුන්ගේ ස්වශක්තිය හා සාමූහිකත්වය වර්ධනය කිරීම සඳහා සහභාගිත්ව සංවර්ධන සංකල්පය මත පදනම් වූ විපර්යකාරක නම් වූ කාර්යබද්ධ පුහුණු පර්යේෂණ වැඩසටහන තුළින් නව සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වාදුන් ජාතික ආයතනයකි. නිෂ්පාදනයේදී, අලෙවියේදී, පරිභෝජනයේදී සහ ණය ක්‍රියාවලියේදී දිළිඳු ප්‍රජාව මුහුණපාන අවාසිදායක තත්ත්වය වඩා වාසිදායක තත්ත්වයක් බවට සහමුලින්ම පරිවර්තනය කර ගැනීමට අවශ්‍ය බලගැන්වීමේ උත්ප්‍රේරණ ක්‍රියාවලිය මෙම ආයතනයේ කාර්යභාරයකි. අත්හදා බැලීම තුළින් කාර්යබද්ධව ඉගෙනීමේ ක්‍රියාවලිය සමාජ සජීවීකරණය නම් වැඩිහිටි අධ්‍යාපන නව ක්‍රමවේදය මේ සඳහා භාවිතා කරති. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය පසුකාලීනව ශ්‍රී ලංකාව තුළ ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම පිටු දැකීමේ අරමුණින් ක්‍රියාත්මක සියලුම ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සඳහා ගලපා ගන්නා ලදී. මෙකී කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමය ඔස්සේ සංවර්ධනය කරන ලද පුහුණු මාදිලි 12 ක් ඔස්සේ ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධනයේ නියුතු රාජ්‍ය, රාජ්‍ය නොවන හා ප්‍රජා සංවිධාන වැඩකරුවන් සඳහා අභ්‍යාසකරණය තුළින් ඔවුන් සවිබලගැන්වීම සිදුකරනු ලබයි.

1.6.11 ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

1996 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මඟින් හා 1999 අංක 33 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධිත) පනත මඟින් ස්ථාපිතව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන හා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයකි.

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප්ලාභීන් නොවන සියලු දෙනා වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සැලසීම මණ්ඩලයේ කාර්යභාරය වේ.මෙහිදී ස්වයං රැකියා නියුක්තිකයින්, පුද්ගලික අංශයේ

සේවා නියුක්තිකයින්, විදේශ සේවා නියුක්තිකයින්, කලාකරුවන්, දේශීය වෛද්‍යවරුන් ආදී සෑම ක්ෂේත්‍රයක් සඳහාම සේවා සැපයීම මෙහි කාර්යභාරය වේ.

1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත අනුව ව්‍යවස්ථාපිත අරමුණු පහත පරිදි වේ.

- ස්වයං රැකියා වල නියුතු තැනැත්තන්ට ඔවුන් වයෝවෘද්ධ කාලයේදී හෝ ඔවුන් යම් අශක්නුතාවයකට පත්වූ විට එම කාලයේදී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැලසීම.
- ස්වයං රැකියා වල නියුතු තැනැත්තන් මියගිය විට, ඔවුන්ගේ යැපෙන්නන්ට සහන සැලසීම.
- ස්වයං රැකියා වල නියුතු තැනැත්තන්ට ඔවුන්ගේ අදාල වෘත්තියවල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩි දියුණු කිරීම.
- ස්වයං රැකියා වල යෙදෙන තරුණයන් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩි දියුණු කිරීම.
- සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම.
- සාමාන්‍යයෙන් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.

1.6.12 ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ආරම්භය , 1985 දී දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව ස්ථාපිත කිරීම දක්වා ඈතට විහිදී යයි. 1997 වර්ෂය අවසානයේදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 17, රජරට, රුහුණු, වයඹ, ඌව, කඳුරට හා සබරගමුව සංවර්ධන බැංකුව වශයෙන් පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන සංවර්ධන බැංකු 6 ක් ලෙස ස්ථාපිත කරන ලදී. 2010 වර්ෂයේ මැයි මාසයේදී මෙම බැංකු 6 ඒකාබද්ධ කරමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ජාතික තලයේ බැංකුවක් ලෙස පිහිටුවන ලදී.

2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පූර්ණ රාජ්‍ය බැංකුවක් වේ. මෙම බැංකුව ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා ඔවුනගේ අවශ්‍යතාවයන්ට සරිලන මුල්‍ය පහසුකම් සැපයීම තුලින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම අරමුණු කරගෙන පිහිටුවා ඇත. විශේෂයෙන්ම ‘‘පාවහන් රහිත බැංකු සංකල්පය’’ පදනම් කරගෙන නව්‍යවූත් සරලවූත් මුල්‍ය සේවාවන් ආදායම් පිරමීඩයේ මධ්‍යම හා පහල ස්ථරයේ සිටින්නන්ට සැපයීම අප බැංකුව විසින් සිදු කරයි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, කාන්තාවන් මෙන්ම කෘෂි කාර්මික, සත්ව පාලන, මත්ස්‍ය ව්‍යාපාර වැනි රටේ ආර්ථික වර්ධනයට දායකත්වය දක්වන ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා විශේෂත්වයක් දක්වයි. එසේම ඉතුරුම් හා ස්ථාවර තැන්පතු

සඳහා ඉහල පොළියක් ලබා දෙමින් ග්‍රාමීය ජනතාව අතර ඉතුරුම් පුරුදු ඇති කිරීම සඳහා කටයුතු කරමින් සිටින අතර පාසල් ළමුන් හා කුඩා දරුවන්ද ඉතුරුම් සඳහා දිරිමත් කරනු ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස අප බැංකුව මිලියන 6 ඉක්මවන ගනුදෙනුකරුවන් සංඛ්‍යාවකට හිමිකම් කියන අතර 3,000 කට අධික සේවක සංඛ්‍යාවක් අපගේ සේවා ස්ථාන 276 ක් පුරා සේවයේ නියුක්තව සිටී.

1.6.13 රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව

රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව 2020 නව රජය යටතේ අංක 2205/15 ගැසට් පත්‍රයට අනුව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ යටතට පත් කර ඇති 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද මහා භාණ්ඩාගාරයට සියළු කොටස් අයිතිව පවතින සීමිත සමාගමකි.

අරමුණු

රාජ්‍ය ව්‍යවසායයන්ට අයත් ඌන උපයෝජිත ආර්ථික සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සඳහා උපායමාර්ගික සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමත්, ස්ථාපිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ව්‍යාපාරවලට මග පෙන්වමින් ජාතික ආර්ථිකයට ඵලදායී ලෙස දායක වීම.

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

පාලන අංශය

ප්‍රගතිය

2021 වර්ෂයේ ආරම්භයේ දී පාලන අංශය විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා පහත දැක්වෙන පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලදී.

I. ආකල්ප හා දැනුම වර්ධන පුහුණු වැඩසටහන්

II. කුසලතා හා දැනුම වර්ධන විෂයානුබද්ධ පුහුණු වැඩසටහන්

- පොදුවේ කරනු ලබන විෂයානුබද්ධ කුසලතා හා දැනුම වර්ධන පුහුණු වැඩසටහන්
- බාහිර සම්පත්දායක ආයතනවලට යොමු කරනු ලබන විෂයානුබද්ධ කුසලතා හා දැනුම වර්ධන තනි පුද්ගල පුහුණු වැඩසටහන්

(විස්තරාත්මක වාර්තාව පිටු අංක 72, 73)

සැලසුම් හා මෙහෙයුම් අංශය

ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

I. අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය සඳහා අවශ්‍ය මූලික දත්ත හා තොරතුරු රැස් කිරීමට කටයුතු කර ඇත.

II. 2021 වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා අවශ්‍යතාවය අනුව එම ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර ඇත.

III. 2020 වර්ෂයට අදාලව අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.

IV. 2021 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කිරීම.

V. 2021 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය සමාලෝචනය සඳහා කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

VI. අමාත්‍යාංශයේ විෂය පථයට අදාල විවිධ පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍යතාවය අනුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය

I. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ඇති කිරීම සඳහා වෙන් වූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 4,874.00 කි.

II. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය මඟින් ක්‍රියාත්මක නිෂ්පාදන ගම්මාන ඇති කිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 4,825.00 කි.

III. තනි මාපිය පවුල් ව්‍යාපෘතිය සඳහා රු.මි. 48.5 ක් මෙම වැඩසටහනට වෙන් වූ ප්‍රතිපාදන තුළින් ලබා දී ඇත. (විස්තර පිටු අංක 25, 26)

ප්‍රගතිය

I. නිෂ්පාදන ගම්මාන 574 ක් ස්ථාපනය කිරීම

II. පොදු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් 1,436 ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම

III. ප්‍රවර්ධන වැඩසටහන් වලට අදාලව රු.මි. 48 ක බිල්පත් පියවීම

IV. රු.මි 73.49 ක අතැති බිල්පත් ගෙවා අවසන් කිරීම

V. නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රගතිය රු.මි. 2,811.610 කි.

VI. 2020 වර්ෂයේ ක්‍රියාත්මක අතැති බිල්පත් රු.මි. 73.49 ගෙවා අවසන් කිරීම

VII. අතැති බිල්පත් ප්‍රමාණය රු.මි. 1,270.21 කි.

විශේෂ ජයග්‍රහණ

සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශයේ ආරම්භක වර්ෂය වන පසුගිය වසරේදී ම කාර්යාංශය විසින් සුවිශේෂී ජයග්‍රහන රැසක් අත්කර ගැනීමට සමත්විය. විශේෂයෙන්ම 2021 වර්ෂය පුරාම දිවයිනෙහි බල පැවති කොරෝනා වසංගතය මධ්‍යයේ වුවද ආයතන රැසක සම්බන්ධීකරණයෙන් කල යුතු නවමු වැඩසටහනක් වූ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ස්ථාපිත කිරීම අති සාර්ථක අන්දමින් ඉලක්ක සපුරා ගනු ලැබිනි. වැඩසටහන යටතේ සාම්ප්‍රදායික මෙන්ම නව සංකල්ප යටතේ නිෂ්පාදන ගම්මාන දිවයින පුරා සියළුම දිස්ත්‍රිකයන් ආවරණය වන පරිදි පිහිටුවන ලද අතර ඒ අතරින් ඇතැම් නිෂ්පාදන ගම්මාන මේ වන විටත් අපනයන වෙළඳපල සඳහා තම නිෂ්පාදන සාර්ථකව ඉදිරිපත් කරන ලබනු අතර පවතින ආනයන සීමා කිරීම් හමුවේ ආනයන ආදේශන දේශීය වෙළඳපල වෙත ලබා දීම මගින් නිෂ්පාදකයින් මෙන්ම පාරිභෝකයින්ටද මෙම නිෂ්පාදන ගම්මාන පිහිටුවීම මගින් සහන සැලසී ඇත.

එමෙන්ම ජීවනෝපාය සංවර්ධනයෙහි ලා මනාව සංවර්ධනය කරණු ලැබූ යටිතල පහසුකම් මගින් ලබාදෙනු ලබන පිටුබලය සැලකිල්ලට ගෙන දිවයින පුරා යටිතල පහසුකම් සංවර්ධනය සිදු කරන ලදි. යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන මූලික ඉලක්කයන්ද ඉක්මවා යමින් ඉතා ඉහළ කාර්ය සාධනයක් අත් කරගනු ලැබිනි. ඒ අනුව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති එක්දහස් දෙසීය පනහක් සංවර්ධනය

කිරීම ආරම්භක ඉලක්කය වූවද වසර අවසානය වන විට සමස්තයක් ලෙස යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති එක්දහස් හාරසිය තිස් හයක් සංවර්ධනය කර අවසන් කිරීමට හැකිවීම සුවිශේෂී ජයග්‍රහනයක් ලෙස දැක්විය හැකිය.

අභියෝග හා ඉදිරි ඉලක්ක

නිෂ්පාදන ගම්මානයන්හි අඛණ්ඩ වැඩි දියුණුව හා ස්වාධීන නිෂ්පාදන ඒකක ලෙස ක්‍රියාත්මක කිරීම තිරසර සංවර්ධනය උදෙසා අත්‍යාවශ්‍ය සාධකයකි. පසුගිය වසර තුල දිවයිනෙහි පැවති ආනයන සීමා කිරීම්, වරින්වර පැවති රට වසා තැබීම වැනි කරුණු හේතුවෙන් ඇතැම් නිෂ්පාදන ගම්මාන සැලසුම් කල අයුරින්ම සම්පූර්ණ කිරීමට නොහැකිවීම මෙම කාර්යාංශය මුහුන පෑ අභියෝගයකි.

මෙම අභියෝගය ජය ගැනීම සඳහා පසුගිය වසර තුලදී සථාපනය කරන ලද නිෂ්පාදන ගම්මාන වැඩි දියුණු කිරීමට අත්‍යවශ්‍ය වන අංග සම්පූර්ණය කිරීම සඳහා සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය මගින් 2022 වසර සඳහා ඉලක්ක කර ඇත. මේ යටතේ නව නිෂ්පාදකයින් වැඩසටහනට ඇතුලත් කර ගැනීම, නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට හා නිෂ්පාදන ධාරිතාව ඉහල නැංවීමට ඉවහල් වන නව යන්ත්‍රෝපකරණ ලබා දීම, නව තාක්ෂණය හා පුහුණුව ලබා දීම කෙරෙහි අවධානය යොමු කර ඇත. වඩාත් පුළුල් ප්‍රචාරණයක් මෙම නිෂ්පාදන ගම්මාන ලබා දීම මගින් නිෂ්පාදන ගම්මාන සඳහා නව වෙළඳපල විවර කර දීම මෙන්ම ස්ථාවර වෙළඳපලක් ඇති කර දීමට ද ඉලක්ක කර ඇත.

එමෙන්ම 2022 වර්ෂය තුලදී ද දේශීය ආර්ථිකයේ ප්‍රධානම සංරචකයක් වන සංචාරක කර්මාන්තය ප්‍රවර්ධන නිෂ්පාදන ගම්මාන දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ස්ථාපිත කිරීමට ඉලක්ක කර ඇති අතර මේ යටතේ විවිධ තේමාවන්ට අදාළව වඩාත් නවමු සංචාරක අත්දැකීමක් දේශීය මෙන්ම විශේෂයෙන්ම විදේශීය සංචාරකයින් වෙත ලබා දීමට අපේක්ෂිතය.

උපදේශන අංශය

විශේෂ ජයග්‍රහණ හා ප්‍රගතිය

මුළු වාර්ෂික ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)
10.232	**10.128**

I. ප්‍රමිතිගත උපදේශන සේවාව සැපයීම සඳහා සකස් කරන ලද නෛතික රාමුව සකස් කිරීම සඳහා රු. මිලි.0.133 ක වියදමක් දරා පිටපත් 116 ක් මුද්‍රණය කර ඇත.

II. විධිමත් ක්‍රමවේදයක් සහිතව ප්‍රතිනිර්මාණය කරන ලද 24 පැය ජංගම දුරකථන උපදේශන සේවාව මඟින් සේවාලාභීන් 2,662 ක් සඳහා උපදේශනය ලබාදී ඇත.

III. උපදේශන සේවාව ප්‍රවර්ධනය සඳහා සේවාලාභීන් හඳුනා ගැනීමේ පත්‍රිකා 41, 000 ක්, උපදේශන අත්පොත් (සිංහල) 50, 000 ක්, උපදේශන අත්පොත් (දෙමළ) 10 000 ක් මුද්‍රණය කිරීම හා උපදේශන අංශය වෙනුවෙන් වෙබ් පිටුවක් සකස් කිරීම.

IV. ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සම්බන්ධීකරණය හා අධීක්ෂණය කරන ලද උපදේශන ක්‍රියාකාරම් සඳහා රැස්වීම් 77 ක් පවත්වා ඇත.

V. ප්‍රජාව මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරු වීම වැළැක්වීම සඳහා කණ්ඩායම් උපදේශන වැඩසටහන් පවත්වා ඇත.

VI. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ උපදේශන වැඩසටහන් 1,041 ක් පැවැත්වීම (ප්‍රතිලාභීන් ගණන - 34,735 කි).

VII. රාජ්‍ය නිලධාරීන්/ ප්‍රජාව/ අධ්‍යාපනික ආදී ක්ෂේත්‍ර සඳහා වැඩසටහන් 1,179 ක් පැවැත්වීම (ප්‍රතිලාභීන් - 52,884 කි).

VIII. Zoom තාක්ෂණය භාවිතයෙන් සහභාගිකයන් 435 ක් සඳහා වැඩසටහන් 03 ක් පැවැත්වීම.

IX. උපදේශන සේවාව වඩාත් පුළුල් කිරීමේ අරමුණින් සිත්සරණ උපදේශන මධ්‍යස්ථාන ඉදි කිරීම, ඉඩකඩ වෙන් කරගැනීම, නඩත්තු කටයුතු සිදු කිරීම හා කාර්යාල උපකරණ ලබා දීම සිදු කරන ලදී.

X. මාර්ගගත දත්ත ගබඩාවක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම සඳහා සේවාලාභී සැසි 2,091 ක් පැවැත්වීම.

ඉදිරි ඉලක්ක

I. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවල ප්‍රතිලාභීන්ගේ මානසික සවිබලගැන්වීම වර්ධනය කිරීම හා ආර්ථික සවිබලගැන්වීම උදෙසා උපදේශන මැදිහත්කරණය

II. සංවර්ධනාත්මක හා නිවාරණාත්මක උපදේශන වැඩසටහන් පැවැත්වීමෙන් මනෝ සමාජයීය ගැටලු අවම කිරීම

III. ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන උපදේශන වැඩසටහන් සඳහා ප්‍රජා සහභාගිත්වය ඉහළ නැංවීම

IV. උපදේශන සේවාවේ නිරත උපදේශකයින් සහ ආයතන පිළිගත් විධිමත් නියාමන ක්‍රමවේදයක් මඟින් උපදේශන සේවාව සම්බන්ධයෙන් ප්‍රජාව තුළ විශ්වසනීයත්වය ගොඩනැඟීම

V. උපදේශන සේවාව අවශ්‍ය, නමුත් ඒ සඳහා සෘජුව යොමුවීමට අකමැති හෝ නොහැකි සේවාලාභීන්ට දුරකථන පහසුකම් ඔස්සේ උපදේශන සේවාව ලබා දීමේ ක්‍රමවේදය සංවර්ධනය කිරීම

VI. උපදේශන සේවාව සම්බන්ධයෙන් සමාජගත වී ඇති විවිධ මතවාද නිවැරදිකිරීම හා පැහැදිලි අවබෝධයක් සමාජගත කිරීම

VII. මානසික රෝග හා මානසික සෞඛ්‍ය ක්ෂේත්‍ර පිළිබඳ සමාජයේ පවතින අවමාන සහගත ලේබල් කිරීම් දුරු කර උපදේශන සේවා සඳහා යොමුවීමට පහසුකම් සැලසීම

VIII. උපදේශන සේවාව පිළිබඳ පවතින නව ප්‍රවණතා හා ක්‍රම ශිල්ප පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා අවස්ථා වැඩි දියුණු කිරීම

ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දෙන අභියෝග

I. ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ආකල්ප සංවර්ධන වැඩසටහන්, මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, ජීවන ඉලක්ක ගොඩනැංවීම වැනි උපදේශන වැඩසටහන් සඳහා තරුණයන්ගේ සහභාගිත්වය ඉතා අඩු අගයක් පෙන්වීම තුළින් රටේ සංවර්ධනයට තරුණයන්ගේ දායකත්වය නිසි පරිදි නොලැබීම

II. පවුල් සබඳතා හා දරුවන්ගේ ගැටලුවලදී සැමියා හා බිරිඳ යන දෙදෙනාගේම දායකත්වය අත්‍යාවශ්‍ය වුවද සැමියාගේ දායකත්වය ලබාගැනීම අපහසු නිසා මැදිහත්කරණය සාර්ථක නොවීම

III. උපදේශන සේවාව හරහා ක්ෂණික විසඳුම් ලබාගත නොහැකි අතර ඒ සඳහා සැසි කිහිපයකට පැමිණීමට සිදුවන නිසාත් ආර්ථික දුෂ්කරතා නිසාත් සේවාලාභීන් උපදේශන සැසි කිහිපයකට පැමිණීමට එකඟතාව නොදැක්වීම

IV. මානසික රෝග හා මානසික සෞඛ්‍ය ක්ෂේත්‍ර පිළිබඳ සමාජයේ පවතින අවමාන සහගත ලේබල් කිරීම නිසා උපදේශන සේවාව ලබා ගැනීමට යොමු වීමට අකමැති වීම

V. උපදේශන සේවාවක් සැපයීමට සුදුසු පරිසරයක/ වාතාරණයක් සහිත සහ අවම මට්ටමින් හෝ ප්‍රමාණවත් පහසුකම් ඇති උපදේශන මධ්‍යස්ථාන හෝ උපදේශන කාමර බොහෝ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නොමැති වීම

VI. වර්තමානයේ මාධ්‍ය ක්ෂේත්‍රයේ විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් උපදේශන සේවාව හා වෘත්තීය පිළිබඳ නිවැරදි මෙන්ම පැහැදිලි අවබෝධයක් සමාජගත කිරීමට නොහැකිවීම

VII. උපදේශන සේවාව පිළිබඳ පවතින නව ප්‍රවණතා හා ක්‍රම ශිල්ප පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා පවතින අවස්ථා සීමාසහිත වීම

VIII. උපදේශන ක්ෂේත්‍රය පිළිබඳ විශේෂ ප්‍රාගුණ්‍යයක් සහිත විද්වතුන් සම්පත්දායකයන් ලෙස රාජ්‍ය ආයතනයන්හි කුසලතා සංවර්ධන වැඩසටහන්වලට ඔවුන්ගේ දායකත්වය ලබාගත නොහැකි වීම

IX. උපදේශන ක්ෂේත්‍රය සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් වලට සහභාගී විමට තිබෙන අවස්ථාවන් සීමාසහිත වීම

ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය

1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නව පනත් කෙටුම්පත

මෙම පනත විශේෂ කමිටුවක් හරහා කෙටුම්පත් කරන ලද අතර, මේ වන විට සියලු කටයුතු අවසන් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ තෙවන වරටත් අධීක්ෂණය 2019.07.19 දින යොමු කරන ලදී. නමුත් නව රජය යටතේ දැනට ක්‍රියාත්මකව පවතින සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති මාලාවට අනුගතව උක්ත පනත් කෙටුම්පත සකස් කළ යුතු බැවින් සහ සංශෝධිත පනත් කෙටුම්පත සඳහා නව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු බැවින් අමාත්‍යාංශය මඟින් නැවත කෙටුම්පත සංශෝධනයට පියවර ගනිමින් පවතී. ඒ අනුව 2021 වර්ෂය තුළ සාකච්ඡා වාර කිහිපයක් පවත්වා පනත් කෙටුම්පතෙහි වැඩි කොටසක් මේ වන විට සංශෝධනය කර ඇත.

සංඥා භාෂා පනත් කෙටුම්පත

සංඥා භාෂා පනත් කෙටුම්පත් කමිටුවේ එකඟත්වය සහිතව සංශෝධනය කරන ලද පනත් කෙටුම්පත 2020.02.24 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යවන ලදී. තවද සංඥා භාෂාව විධිමත් සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් පිළිගැනීම උදෙසා නව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් 2020.12.17 දින සංදේශයක් ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා 2021.01.18 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලැබී ඇත. 2021.12.23 දින නීති කෙටුම්පත් සම්පාදක විසින් අඩුපාඩු දන්වා එවන ලද කෙටුම්පත සකස් කිරීම සඳහා 2021.12.30 දින පැවති සභාවේ දී 8 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර ගන්නා ලදී.

ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය

රජයේ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු පිණිස 2006.10.17 හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය හා එය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය වර්තමානයේ පවතින තත්ත්වයන්ට ගැළපෙන පරිදි නැවත සකස් කිරීමට කටයුතු කර ඇත.අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා සංශෝධන සිදු කළ අතර මේ වන විට කමිටුවේ අවසාන නිරීක්ෂණ සිදු කරමින් පවතින අතර, 2022 වසරේදී එය සම්මත කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

සුදුසැරයටි ගැසට්පත්‍රය

දෘශ්‍යාබාධිත ප්‍රජාව වෙනුවෙන් 2021/27 අංක හා 2017.05.31 දිනැති ව 2017 අංක 01 දරණ සුදුසැරයටි රීතීන් ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කරන ලදී.

ආබාධ සහිත තැනැත්තන් සඳහා පසුගෙවුම් පැකේජයක් හඳුන්වා දීම

ආබාධ සහිත තැනැත්තන්ගේ සන්නිවේදනයට ඇති ප්‍රවේශය තහවුරු කිරීමෙහි ලා හඳුන්වා දී ඇති ජංගම දුරකථන පසුගෙවුම් පැකේජය තවදුරටත් පහසුකම් පුළුල් කරමින් ආබාධිත ප්‍රජාවට වඩා වැඩි ප්‍රතිලාභ ලැබෙන අයුරින් සකස් කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට ද කටයුතු කෙරේ.

ආබාධ සහිත තැනැත්තන් සඳහා රු. 5,000 මාසික ජීවනාධාර ලබා දීම

ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2007 වසරේ සිට ක්‍රියාත්මක මෙම වැඩසටහන මඟින් ආබාධ සහිත තැනැත්තන් හා ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීම සඳහා කටයුතු කෙරේ. ජීවන මට්ටම උසස් කිරීම,පෝෂණය ඉහළ යාම, මානසික හා සමාජීය තත්ත්වය ඉහළ යාම මෙහි දී හඳුනා ගත හැකිය.

මෙතෙක් ලබාදුන් රු. 3,000 ජීවනාධාරය 2019 වසර සඳහා රු.5,000 ලෙස වැඩි කර, 32,000 වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාවට නව ප්‍රතිලාභීන් 40,000 ක් එක් කර මුළු පිරිස 72,000 ක් දක්වා වැඩි කිරීමට පියවර ගෙන ඇත.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
72,000	4,320.00	4,311.337

වික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාමට ආධාර ලබා දීම

ඇඳගත රෝගීන් 147 පමණ සඳහා සේවා සපයන රාජගිරිය වික්ටෝරියා නිවාසයේ සේවක වැටුප් හා දීමනා, ජල , විදුලි හා දුරකථන බිල්පත් ගෙවීම වෙනුවෙන් මසකට රු. ලක්ෂ 7 පමණ බැගින් රු.මී 8.6 ක මුදලක් ලබා දීමට කටයුතු කර ඇත.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
147	8.6	8.6

වකුගඩු රෝගීන් සඳහා රු. 5,000/- ජීවනාධාර ලබා දීම

මූලය හඳුනා නොගත් කාලික වකුගඩු රෝගීන් සඳහා මාසික දීමනා ගෙවීම 2015 වසරේ සිට ක්‍රියාත්මක වේ. රු.3,000 ජීවනාධාරයක් වශයෙන් ආරම්භ කරන ලදුව වර්තමානයේ රු.5,000 ජීවනාධාරයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිර්දේශිත කාලික වකුගඩු රෝග ව්‍යාප්ත දිස්ත්‍රික්ක 11 තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 84 ක රෝගීන් ජනවාරි සිට අගෝස්තු මාසය දක්වා ඇතුලත් වූ අතර සැප්තැම්බර් මාසයේ සිට දිවයිනම ආවරණය වන පරිදි, සියලුම වර්ගයේ වකුගඩු රෝගවලින් පෙළෙන ප්‍රතිලාභීන් 39,169 ක් සඳහා ගෙවීම් සිදු කිරීමට හැකි විය.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
39,169	2,349.00	2,326.076

ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකියා පුහුණුව ලබාදීම

රැකියාවක නියැලිය හැකි මට්ටමක සිටින ආබාධ සහිත තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ රැකියාවක් සඳහා යොමු කරන අතර, එම ආයතනය ගෙවනු ලබන වැටුපෙන් 50% (උපරිමය රු.15,000 ක් වන පරිදි) මාස 24ක් සඳහා මෙම කාර්යාලය මඟින් ගෙවීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව, 2019 වර්ෂයට අදාළව මෙම ව්‍යාපෘතියේ මූලික අදියරේ කටයුතු අවසන් කර ඇත. එහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආබාධ සහිත තැනැත්තන් හඳුනා ගැනීම, රැකියා සැපයීමට එකඟත්වය පළ කරන පෞද්ගලික ආයතන සම්බන්ධීකරණය වැනි කාර්යයන් සිදු කරන ලදී. ඒ අනුව, සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සාකච්ඡා මඟින් මෙන්ම චක්‍රලේඛයක් මඟින් ද දැනුවත් කර ඇති අතර, ගිවිසුමක් මඟින් පෞද්ගලික ආයතන සම්බන්ධීකරණය කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව හඳුනා ගත් ආබාධ සහිත තැනැත්තන් 130 ක් පමණ 2021 වසරේ දී රැකියා ගත කිරීමට කටයුතු කරන ලදී. 2022 වසර සඳහා රැකියාගත කිරීමට 150 ක පමණ පිරිසක් හඳුනා ගෙන ඇත.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
130	10.00	9.975

වෛද්‍ය ආධාර ලබා දීම

ආබාධ සහිත තැනැත්තන් හා දිගු කාලීන රෝගවලට ගොදුරු වූවන් ආබාධ තත්ත්වයට පත්වීම වැළැක්වීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. එහි දී රජයේ රෝහලින් නොසපයන ඖෂධ ලබා ගැනීමට,සායනවලට සහභාගී වීම සඳහා හා හෘද, අක්ෂි, වකුගඩු, මොළය, උකුල් ඇට, කර්ණ පටක බද්ධය ආදී ඕනෑම සැත්කමක් සඳහා අවශ්‍ය වන වියදම් පියවා ගැනීමට රු.6000 ට අඩු ආදායම් ලබන පවුල් සඳහා උපරිමය රු.20,000 ක් දක්වා මේ යටතේ ආධාර ලබාදේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
967	13.592	13.592

ආධාරක උපකරණ ලබා දීම

ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය සඳහා උපකාර වෙමින්, අන්තර්කරණ සංවර්ධනයට දායක කර ගැනීමට හා ඔවුන් ස්වාධීන පුද්ගලයන් බවට පත් කිරීම සඳහා ඇස් කණ්ණාඩි, රෝදපුටු, ශ්‍රවණ උපකරණ,ත්‍රෛසිකල්, අත්වාරු, කිහිළිකරු ආදිය උපකරණ වශයෙන් ද වායු මෙට්ට,ජල මෙට්ට ආදී විශේෂ උපකරණ සඳහා උපරිම රු. 20,000 දක්වා මුදල් ආධාර ලබාදීම සිදු කෙරේ. රු. 6,000 අඩු ආදායම් ලබන පුද්ගලයන් සඳහා වෛද්‍ය නිර්දේශ මත මෙම ආධාරය ලබා දේ. මෙම වර්ෂය තුළ ජංගම සේවා 17 ක් පවත්වා උපකරණ 10,234 ක් බෙදා දී ඇත.

කොමඩ් රෝදපුටු	රෝදපුටු	අත්වාරු	කිහිළිකරු	වෝකර්	ළමා රෝද පුටු	ඇස් කණ්නාඩි	විශේෂ උපකරණ
49	53	38	15	11	02	10,061	5

හැකියා වර්ධන වැඩසටහන

ආබාධ සහිත තැනැත්තන්ගේ හා ආබාධ සහිත තැනැත්තන් ඉගෙනුම ලබන විශේෂ අධ්‍යාපන ඒකක සඳහාද ඔවුන්ගේ ක්‍රීඩා, කලා හා සෞන්දර්යාත්මක හැකියාවන් මෙන්ම වෙනත් දක්ෂතා ඔප්නැංවීමේ අරමුණින් රු.50,000 ක උපරිමයක් දක්වා මූල්‍ය අනුග්‍රහය ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
ආයතන 03	0.15	0.15

ස්වයං රැකියා ආධාර ලබාදීම

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන්ගේ පවුල්වල පවතින දරිද්‍රතාවය අවම කිරීම සඳහා ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා එක් පුද්ගලයකුට හෝ පවුලකට උපරිම රු.25,000 ක් දක්වා ස්වයං රැකියා ආධාර ලබාදීම මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ. එසේම, ස්වයංරැකියාව නියාමනය, නිෂ්පාදනවල ගුණාත්මක බව වැඩි කිරීමට මඟපෙන්වීම හා අලෙවිය සඳහා මැදිහත්වීම ද මෙහි දී සිදු කෙරේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
ප්‍රතිලාභීන් 200	5.00	4.99

අධ්‍යාපන ආධාර ලබා දීම

අඩුආදායම් ලබන ආබාධ සහිත දරුවන් හා ආබාධ සහිත භාරකරුවන්ගේ දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීමේ වැඩසටහනකි. මෙම වැඩසටහන යටතේ ජීවිත කාලයටම එක් වරක් ලැබෙන උපරිමය රු.10,000 වන පරිදි අධ්‍යාපන උපකරණ ලබා ගැනීම සඳහා ආධාර දෙනු ලැබේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
ප්‍රතිලාභීන් 621	5.5	5.5

ස්වේච්ඡා සංවිධාන බලගැන්වීම

මෙම මහ ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි ආයතන 144 ක් පවතින අතර මෙම ආයතන බොහෝමයක් විධිමත් මූල්‍ය ආධාර නොලබන ආයතන වේ. ලැබෙන ඉල්ලීම් අනුව, ක්ෂේත්‍ර පරීක්ෂණ

මඟින් තහවුරු කර ගැනීමෙන් පසු එම ආයතනවල භෞතික ඉදිකිරීමක් සඳහා රු.200,000 ක් දක්වා මූල්‍යාධාර ලබාදීමට මෙම වැඩසටහනින් කටයුතු කෙරේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
ආයතන 3	0.575	0.575

ජාත්‍යන්තර ආබාධිත දිනය සැමරීම

මෙවර ජාත්‍යන්තර ආබාධිත දින සැමරුම් උළෙල "ආබාධ සහිත පුද්ගලයින්ගේ නායකත්වය සහ සහභාගීත්වය ඇතුළත්, ප්‍රවේශ විය හැකි සහ තිරසාර පශ්චාත් - COVID - 19 ලෝකයක් කරා" යන්න තේමාව කර ගනිමින් කොවිඩ් 19 වසංගතයට අදාළ සෞඛ්‍ය උපදෙස් අනුව යමින් 2021.12.03 දින ආබාධ සහිත තැනැත්තන් 100 ක ගේ සහභාගිත්වයෙන් අපේ ගම පරිශ්‍රයේ දී උත්සවකාරයෙන් පවත්වන ලදී.අධ්‍යාපන, ක්‍රීඩා, කලා ආදී අංශ වලින් දක්ෂතා දැක්වූ ආබාධ සහිත දරු දැරියන් ඇගයීම මීට සමගාමීව සිදු විය.මේ සඳහා මුළු වියදම රු.මි 3.457 වූ අතර මෙම වසරට වෙන් කරන ලද රු.මි 0.5 ට අමතරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලද ප්‍රතිපාදන හා පෙර වසර වල ඉතිරි වූ මුදල් ද යොදා ගන්නා ලදී.

නිවාස ආධාර ලබාදීම

කිසිම ආදායම් මාර්ගයක් නොමැති, ඉඩමක් සඳහා හිමිකම් ඇති නමුත් නිවසක් අහිමි ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවසක් තනා දීමේ වැඩසටහන 2001 වසරේ සිට ක්‍රියාත්මක කරන අතර, ජාතික ලොතරැයි මණ්ඩලයේ සුපිරි වාසනා ලොතරැයිය මඟින් ලබන ආදායමින් 5% ක් වාර්ෂිකව මෙම අරමුදල සඳහා වෙන් කිරීමෙන් මූල්‍ය ප්‍රතිපාදන සපයා ගනු ලැබේ.

නව නිවසක් ඉදි කිරීම සඳහා රු.250,000ක මුදලක් ද අලුත්වැඩියා කර ගැනීමක් සඳහා රු.150,000ක මුදලක් වාරික වශයෙන් ලබා දේ.

ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත මෙම වැඩසටහන මන්දගාමී ස්වරූපයක් ගෙන ඇති අතර නිවාස සිහිනය ඇතිව පොරොත්තු ලේඛනවල රැඳී සිටින පිරිස 1027ක් පමණ වේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
වාරික 155	10.50	11.79 (පෙර වසර වල වෙක්පත් නැවත ලැබීම් ද ඇතුළුව)

තනිමාපිය පවුල් සංවර්ධන වැඩසටහන

කාලාතුරයා මිය යාම, දරුවන් හා කාලාතුරයා අතහැර දැමීම වැනි හේතු නිසා තනිමාපිය පවුල් බවට පත්ව ඇති පවුල් සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ යාමක් දක්නට ලැබේ.මෙම පවුල් මුහුන දෙන ආර්ථික, සමාජීය,

මානසික තත්ත්වයන් මඟහරවා ගැනීමට අත්වැලක් සැපයීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. ඒ අනුව උප වැඩසටහන් කිහිපයක් යටතේ තනිමාපිය පවුල් වැඩසටහන ක්‍රියාවට නැංවේ. මේ සඳහා **ප්‍රතිපාදන මෙම ලේකම් කාර්යාලය සඳහා වෙන් නොවූ අතර සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන ජාතික වැඩසටහන සඳහා වෙන් වූ ප්‍රතිපාදන වලින් රු.මි. 48.5 ක් වෙන් කර ගන්නා ලදී. (පිටු අංක 17)**

වැඩසටහන	වාර්ෂික ප්‍රතිපාදන (රු.මි)	**2021.12.31** දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි)	ප්‍රතිලාභීන් ගණන
තනි මාපිය පවුල් සඳහා ස්වයංරැකියා ආධාර ලබාදීම	20.53	19.501	667 ප්‍රතිලාභීන්
තනිමාපිය පවුල්වල දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම	27.39	27.696	3095 ප්‍රතිලාභීන්
කියවීමේ මධ්‍යස්ථාන ආරම්භ කිරීම	0.47	0.345	මධ්‍යස්ථාන 6
හැකියා වර්ධන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	0.06	0.060	වැඩසටහන් 2
ක්ෂේත්‍ර නිරීක්ෂණ	0.05	0.023	1 ක්ෂේත්‍ර නිරීක්ෂණ (මහනුවර)
එකතුව	**48.50**	**47.625**	

සංඥා භාෂාව අතිරේක විෂයක් ලෙස ස්ථාපනය කිරීම

රජයේ නිලධාරීන් සඳහා සංඥා භාෂාව අතිරේක විෂයක් ලෙස ස්ථාපනය කරමින් ඔවුන් මෙම කාර්යෙහි ලා දිරිමත් කිරීමට කටයුතු කෙරේ. ඒ අනුව ආබාධ සහිත තැනැත්තන්ට රාජ්‍ය සේවයේ උපරිම ඵල නෙළා ගැනීමට හැකි වනු ඇත. මේ සම්බන්ධයෙන් අදාළ විෂය නිර්දේශ ආදිය සකස් කර ඇති අතර අදාළ චක්‍රලේඛ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

රැකවරණ මධ්‍යස්ථාන 04 ක් ස්ථාපනය කිරීම

දීප ව්‍යාප්තව රැකවරණ මධ්‍යස්ථාන 6 ක් ඉදි කිරීම සඳහා අමප/18/0755/711/015 අංක දරණ පත්‍රිකාව මඟින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. 2021 වසර සඳහා මධ්‍යස්ථාන 04 ක් ඉදි කිරීමට සැලසුම් කළ ද ඉඩම් අත්පත් කර ගැනීමේ නීතිමය ගැටලු හේතුවෙන් බාධා ඇති වූ බැවින්, මේ වන විට අකුරැස්ස හා දඹුල්ල යන ප්‍රදේශ වල පිහිටි ඉඩම් 02 ක් අත්කර ගත හැකි විය.

පළාත	ස්ථානය	වර්තමාන තත්වය
දකුණ	අකුරැස්ස	සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කර ප්‍රසම්පාදන කටයුතු සඳහා ECD ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට යොමු කර ඇත.
මධ්‍යම	දඹුල්ල	ලෝක බැංකුව විසින් මෙහි පරිසර වාර්තා අනුමත කර ඇත. ඉඩමේ මැනීමේ කටයුතු අවසන් කර ඇති බැවින් සැලසුම් සහ ඇස්තමේන්තු ජාතික ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සකස් කරමින් පවතී.

විශේෂ ජයග්‍රහණ

කොවිඩ් 19 වසංගතය හමුවේ වුවද ඉලක්කගත වැඩසටහන් සාර්ථකව ඉටු කරමින් ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් වෙනුවෙන් උපරිම ප්‍රතිලාභ ලබාදීම සඳහා කටයුතු කිරීමට හැකි විය.

ඉදිරි ඉලක්ක

I. 2022 වන විට සංඥා භාෂා පනත් කෙටුම්පත අනුමත කර ගැනීම

II. දැනට සංශෝධිත මට්ටමේ පවතින ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ පහසුකම් සැපයීමේ ගැසට් පත්‍රයේ කටයුතු අවසන් කිරීම

III. 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සංශෝධන 2022 වන විට අවසන් කිරීම

IV. 2022- 2023 වන විට ආබාධ සහිත තැනැත්තන්ට රැකවරණය සපයන ආයතන 02 ක් ස්ථාපනය කිරීමට කටයුතු කිරීම

V. 2022 දී සංඥා භාෂාව රාජ්‍ය නිලධාරීන් සඳහා අතිරේක විෂයක් ලෙස ස්ථාපිත කිරීම

VI. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීමට පියවර ගැනීම

ජාතික සමාජ සංවර්ධන ආයතනය

ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක වැඩසටහන්හි ප්‍රගතිය

- සමාජ සේවා විද්‍යාලය මඟින් ක්‍රියාත්මක පාඨමාලා

I. සමාජ වැඩ පිළිබඳ ශ්‍රාස්ත්‍රවේදී පාඨමාලා

සිංහල මාධ්‍ය පාඨමාලා 3 ක් ද, දෙමළ මාධ්‍ය පාඨමාලා 3 ක් ද , ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා 6 ක් ද මෙම වසරේ පවත්වා ඇති අතර සහභාගි වූ මුළු සිසුන් ගණන 130 කි. මේ සඳහා රු.මි. 1.75 ක් වියදම් දරා ඇත.

II. සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා

සිංහල මාධ්‍ය පාඨමාලා 3 ක් හා දෙමළ මාධ්‍ය පාඨමාලා 3 ක් පවත්වා ඇත. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 89 කි. මේ සඳහා රු.මි. 0.3 ක් වියදම් දරා ඇත.

- පුහුණු අංශය මඟින් ක්‍රියාත්මක වැඩසටහන්

මෙම අංශය මඟින් පුහුණු වැඩසටහන් කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානයේ හා රන්න, තලාව, අම්පාර, කිලිනොච්චිය, යන ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන හා ත්‍රිකුණාමලය, මාතර, කුරුණෑගල, මඩකලපුව,

රත්නපුරය, නුවර යන නගර කේන්ද්‍ර කරගනිමින් පවත්වා ඇත. ඒ සඳහා ප්‍රතිලාභීන් 5863 ක් පුහුණුවීම් ලබා ඇති අතර මුළු වියදම රු.මි. 0.95 කි.

- සමාජ සංවර්ධන ප්‍රතිපත්ති හා ප්‍රකාශන අංශය මඟින් සිදුකරන ලද පර්යේෂණ, සමීක්ෂණ හා නිකුත් කරන ලද ප්‍රකාශන

I. අධ්‍යයන කටයුතු මණ්ඩලයේ අනුමැතිය යටතේ සමාජ වැඩජර්නලය අර්ධ වාර්කව සකස් කර ඇත - මූල්‍ය ප්‍රගතිය රු, 42,000 කි.

II. අධ්‍යයන කටයුතු මණ්ඩලයේ අනුමැතිය යටතේ සමාජ සංවර්ධන ජර්නලය අර්ධ වාර්ෂිකව සකස් කර ඇත - මූල්‍ය ප්‍රගතිය රු. 18,000 කි.

III. E-Journal අර්ධ වාර්ෂික ප්‍රකාශනය වෙබ් අඩවිය ඔස්සේ පලකිරීමට කටයුතු කිරීම මූල්‍ය ප්‍රගතිය රු. 27,000/- කි.

IV. පුවත් හසුන මුද්‍රණය කර අවසන් කර ඇත. මූල්‍ය ප්‍රගතිය රු, 202,000/- කි.

V. වාර්ෂික පොත් එළිදැක්වීම Book Launch - මූල්‍ය ප්‍රගතිය රු, 48,180/- කි.

VI. ශිෂ්‍ය සමාජ වැඩජර්නලය 2021 - තෝරා ගත් පර්යේෂණ වර්තාපලකිරීමට කටයුතු කිරීම - මූල්‍ය ප්‍රගතිය රු. 7,500/- කි.

VII. පර්යේෂණ ක්‍රම වේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවේ විෂය නිර්දේශය සංවර්ධනය කිරීම

VIII. කොවිඩ් 19 වෛරසය වැළඳුනු ප්‍රජාව සුවපත්භාවයට පත් වූ පසු සමාජ අන්තර් සම්බන්ධතා පැවැත්වීමේදි මුහුණ දෙන මනෝ සමාජීය ගැටලු පිළිබඳ අධ්‍යයනය - දත්ත රැස්කිරීම, දත්ත ඇතුළත් කිරීම ,දත්ත සැලසුම් කිරීම හා වාර්තා ලිවීම.

IX. කොවිඩ් 19 කාලය තුලදි සෞඛ්‍ය ආරක්ෂණය සහ අපද්‍රව්‍ය කළමනාකරණය සිදු කිරීමේ දි පරිසරයට ඇතිවන බලපෑම අනාගත සමාජීය ප්‍රතිවර්ථනය - දත්ත රැස්කිරීම, දත්ත ඇතුළත් කිරීම , දත්ත සැලසුම් කිරීම හා වාර්තා ලිවීම.

X. සමෘද්ධි නිෂ්පාදිත ගම්මාන වල සමාජ ,ආර්ථික තත්ත්වය සොයා බැලීමේ තක්සේරු අධ්‍යයනය 2021 - දත්ත රැස්කිරීම, දත්ත ඇතුළත් කිරීම ,දත්ත සැලසුම් කිරීම හා වාර්තා ලිවීම - මූල්‍ය ප්‍රගතිය රු. 505,291,50 කි.

XI. සමාජ ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රීය ප්‍රකාශනය සකස් කිරීම - පර්යේෂණයේ දත්තයන් සමාජ ගත කිරීම හා නව පර්යේෂණ සඳහා විද්‍යාර්ථයින් යොමු කිරීම - මූල්‍ය ප්‍රගතිය රු. 170,000/- කි.

මුදල් අයකරමින් ක්‍රියාත්මක කරන ලද පාඨමාලා/ පුහුණු වැඩසටහන්

- සමාජ සේවා විද්‍යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද පාඨමාලා

I. සමාජ වැඩ පිළිබඳ ශ්‍රාස්ත්‍රපති පාඨමාලා (MSW)

ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා 4 ක් ද සිංහල මාධ්‍ය පාඨමාලා 3 ක් ද දෙමළ මාධ්‍ය පාඨමාලා 3 ක් ද පවත්වා ඇති අතර සියලුම අධ්‍යයන වර්ෂ වල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 130 කි. පාඨමාලා ගාස්තු ලෙස සිසුන්ගෙන් අය වූ මුදල රු.මි. 6.77 කි. වැය වූ මුදල රු.මි. 1.75 කි.

- පුහුණු අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද පාඨමාලා

I. වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) සිසුන් ගණන 19 කි. මුළු වියදම රු.මි. 0.795 කි.

II. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා

සිංහල මාධ්‍ය පාඨමාලා 11 ක් ද දෙමළ මාධ්‍ය පාඨමාලා 12 ක් ද ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා 2 ක් ද පවත්වා ඇති අතර සියලුම අවසන් වර්ෂ වල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 947 කි. සිසුන්ගෙන් අය වූ මුළු මුදල රු.මි. 10.961 ක් වන අතර වියදම රු.මි. 10.416 කි.

ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය

සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය

සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන රු.මි. 14.9 කි. 2021.12.31 දිනට මුළු වියදම රු.මි. 12.7 කි.

I. පර්යේෂණ අංශය

සමෘද්ධි නිෂ්පාදන ගම්මාන හා සෞභාග්‍යා නිෂ්පාදන පොකුරු ගම්මාන තුළ සිදුවී ඇති, සමාජ - ආර්ථික බලපෑම සහ ඉදිරි සංවර්ධන අවස්ථා හඳුනා ගැනීමේ තත්ත්ව අධ්‍යයනය.

2018 වර්ෂයේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ද සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි නිෂ්පාදන ගම්මාන හා සෞභාග්‍යා පොකුරු ගම්මාන වැඩසටහන තුළින් තෝරා ගත් ගම්මාන තුළ ප්‍රජාවගේ ජීවන තත්ත්වයේ සිදු වූ වෙනස්කම් අධ්‍යයනය කිරීම සිදු කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා ප්‍රතිලාභී පවුල් 2765 ක නියැදියක් පාදක කර ගනිමින් සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි හා ද්විතීයික ක්‍රම ඔස්සේ තොරතුරු රැස්කළ අතර, එම තොරතුරු විශ්ලේෂණය තුළින් පහත සඳහන් කරුණු හඳුනා ගන්නා ලදී.

- නිෂ්පාදන භාණ්ඩවල ගුණාත්මක බව වර්ධනය සඳහා අමතර යන්ත්‍ර/ උපකරණ හා තාක්ෂණය ගලපාගත් ව්‍යවසායකයින් සාර්ථකත්වයට පත්වන බව.
- පවුලේ සාමූහික ශ්‍රම දායකත්වය මත සිදු කරන ලද ආදායම් උත්පාදන මාර්ගවල සාර්ථකත්වය ඉහළ ගොස් ඇත.
- ව්‍යවසාය තුළින් උපයන ආදායමෙන් වැඩි මුදලක් ප්‍රති ආයෝජනයට යෙදවූ ව්‍යවසායකයින් වඩා සාර්ථක වන බව.
- සාර්ථකත්වයට පත් ව්‍යවසායකයින් හට නව රැකියා අවස්ථා නිර්මාණය කිරීමට හැකි වී ඇත.

සමෘද්ධි බැංකුව වැනි ව්‍යවසායකයින් සඳහා ණය සපයන ආයතන මගින් ණය ලබා ගන්නා නිෂ්පාදකයින් වඩා සාර්ථකත්වයට පත්වී ඇත.

- දැනුවත් භාවයට පත් වූ ප්‍රජාව තුළ කැපවීම හා උනන්දුව ඉහළ මට්ටමක පැවතීම නිසා ඔවුන්ගේ ව්‍යාපාර සාර්ථකත්වයට පත් වී ඇත.
- ග්‍රාමීය ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වැඩි මැදිහත් වීමක් ඇති වැඩසටහන් වඩාත් සාර්ථක වී ඇත.
  මේ සඳහා වියදම රු.මි. 0.16 කි.

- දිළිඳුකම තුරන්කිරීමේ වැඩසටහන් පිළිබඳ සිද්ධි අධ්‍යයන වැඩසටහන.
  මුළු දිවයිනම ආවරණය වන පරිදි ගම් 200 පුරා ව්‍යාප්ත සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩසටහන ආශ්‍රිතව තෝරා ගන්නා ලද ගම්මාන 25 ක් සඳහා සිද්ධි අධ්‍යයන 25 ක් සිදුකර ඇත. මේ සඳහා වියදම රු.මි. 0.1 කි.
- ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නිලධාරීන්ගේ මානව සම්පත් සංවර්ධනය.
  මේ යටතේ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ පුහුණු හා පර්යේෂණ කාර්යේ නිරත නිලධාරීන් තුල සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය පිළිබඳ දැනුම, කුසලතාව හා ආකල්ප සංවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා නිලධාරීන් 23 දෙනෙකු සහභාගි වී ඇත. මේ සඳහා වියදම රු.මි. 0.05 කි.
- ග්‍රාම සංවර්ධනය පිළිබඳ පාර්ශවීය ආයතන සම්බන්ධීකරණය කරමින් වැඩසටහන් 2 ක් පවත්වා ඇති අතර ඒ සඳහා නිලධාරීන් 65 දෙනෙකු සහභාගී වී ඇත.

II. පුහුණු අංශය

මෙම වසර තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්වය තුළ පංති කාමර පුහුණු වැඩසටහන් පැවැත්වීමට තිබූ අපහසුව නිසා මාර්ග ගත ක්‍රමය ඔස්සේ පුහුණු වැඩසටහන් ක්‍රියාතක්මක කරන ලදී. ඒ යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ක්ෂේත්‍ර නිලධාරීන්හට පුහුණු වැඩසටහන්වලට සම්බන්ධ වීමට අවස්ථාව ලැබුණි.

වැඩසටහන/ ක්‍රියාකාරකම	වාර්ෂික ප්‍රතිපාදන(රු.මි)	වියදම (රු.මි.)	භෞතික ප්‍රගතිය
ගෘහ කළමනාකරණය හා කුටුම්භ සංවර්ධන ක්‍රියාවලිය තුළින් ව්‍යසායකත්ව පුහුණුව	0.060	0.060	මාර්ග ගත පුහුණු වැඩසටහන් 19, සහභාගිවූවන් 850
සමාජ සජීවීකරණ මැදිහත්කරු පුහුණුව	0.150	0.150	මාර්ග ගත පුහුණු වැඩසටහන් 37, සහභාගිවූවන් 1232
ප්‍රජාමූල සංවිධාන සංවර්ධනය සඳහා නායකත්ව පුහුණුව	0.200	0.020	මාර්ග ගත වැඩසටහන් 02, සහභාගිවන්නන් 90
එකතුව	0.410	0.230	වැඩසටහන් 58, සහභාගිවූවන් 2172

III. ප්‍රකාශන හා සම්බන්ධීකරණ අංශය

- ප්‍රජා ශක්ති සඟරාව ප්‍රකාශයටය පත් කිරීම.

  2021 වසරේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙම සඟරාවේ කලාප 1 හා 2 මුද්‍රණය නොකල අතර ආයතනයේ වෙබ් අඩවියේ පල කරන ලදී.

- තරණය පුවත් හසුන ප්‍රකාශයට පත් කිරීම.

  මෙම ප්‍රකාශනයද මුද්‍රණය නොකල අතර ආයතන වෙබ් අඩවියේ පළ කරන ලදී. ආයතනය විසින් සිදු කරනු ලබන පර්යේෂණ, පුහුණු, ප්‍රකාශන කාර්යයන් වලට අදාළ තොරතුරු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, දිළිඳු ප්‍රජාව හා සංවර්ධන වැඩකරුවන් වෙත සම්ප්‍රේෂණය කිරීම තුළින් ආයතනය මගින් ප්‍රජාවට අවශ්‍ය සේවා ලබා ගැනීමට මග පෙන්වීම සඳහා තරණය පුවත් හසුන ප්‍රකාශයට පත් කිරීම සිදු කරයි.

IV. ආයතනික පුහුණු පහසුකම් සංවර්ධනය කිරීම

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු හා පර්යේෂණ වැඩසටහන් බොරැල්ල ප්‍රධාන කාර්යාලීය පුහුණු මධ්‍යස්ථානයේ හා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානය තුළ දී ක්‍රියාත්මක කරයි. එසේම පුහුණු මධ්‍යස්ථානවල පහසුකම් බාහිර ආයතන විසින් ද ලබාගන්නා අතර, 2021 වසර තුළ කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් බාහිර ආයතන විසින් ඉතා අඩු පුහුණු වැඩසටහන්
සංඛ්‍යාවක් පවත්වා ඇත. එසේ වුවද බොරැල්ල පුහුණු මධ්‍යස්ථානය විසින් බාහිර ආයතනවලට සේවා සැපයීම මගින් මෙම වසර තුළ රු: 538,378.50 ක ආදායමක් උපයාදීමට හැකිවී ඇත.
2021 වසර ආරම්භයේ දී දේශන ශාලා හා නේවාසිකාගාර අලුත්වැඩියා කරගැනීමේ කටයුතු කොවිඩ් 19 වසංගත තත්වය මත යම් ප්‍රමාදවීමක් සිදුවුවත්, වසර මැද භාගය පමණ වන විට එම නවීකරණ කටයුතු නිමකර ගැනීමට හැකි විය. එහිදි සහභාගිවන්නන් 60 දෙනෙකුට අසුන්ගත හැකි දේශන ශාලා අංක 2 සම්පූර්ණ ලෙස නවීකරණය කරන ලදී. අලුතින් නවීකරණය වූ නේවාසිකාගාරය 30 දෙනෙකුට නේවාසික පහසුකම් පවතින අතර මුළුතැන්ගෙය හා ආපනශාලාව නවීකරණය කර ඇත. මේ සඳහා රු.මි. 5.3 ක් වෙන් කරන ලද අතර රු.මි. 3.7 ක වියදමක් දරා ඇත.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

සාමාජිකයන් බඳවාගැනීම

1996.01.01 සිට 2020.12.31 දක්වා එකතුව		2021.01.01 – 2021.12.31 දක්වා එකතුව		2021.12.31 දක්වා මුළු එකතුව	
සාමාජිකයින් සංඛ්‍යාව	මුල් වාරික මුදල (රු. මිලි.)	සාමාජිකයින් සංඛ්‍යාව	මුල් වාරික මුදල(රු. මිලි.)	සාමාජිකයින් සංඛ්‍යාව	මුල් වාරික මුදල(රු. මිලි.)
776,993	512.51	57,803	126.33	834,796	638.84

ප්‍රතිලාභ ගෙවීම

I. විශ්‍රාම වැටුප් ගෙවීම

1996.01.01 සිට 2020.12.31 දක්වා එකතුව		**2021.01.01 – 2021.12.31**		**2021.12.31 දක්වා මුළු එකතුව**	
සාමාජිකයින් සංඛ්‍යාව	වටිනාකම (රු. මිලි.)	සාමාජිකයින් සංඛ්‍යාව	වටිනාකම (රු. මිලි.)	සාමාජිකයින් සංඛ්‍යාව	වටිනාකම (රු.මිලි.)
31,769	2,265.75	32,976	356.9	32,976	2622.65

II. පාරිතෝෂික ගෙවීම

විස්තරය	**1996.01.01 සිට 2020.12.31 දක්වා එකතුව**		**2021.01.01 - 2021.12.31 දක්වා එකතුව**			**2021.12.31 දක්වා එකතුව**	
	සංඛ්‍යාව	වටිනාකම (රු.මිලි.)	සංඛ්‍යාව	පාරිතෝෂික මුදල (රු.මිලි.)	ශුද්ධ දායක මුදල (රු.මිලි.)	සංඛ්‍යාව	වටිනාකම (රු.මිලි.)
මරණ පාරිතෝෂික	2,267	39.51	26	1.5	-	2293	41.01
පූර්ණ අබලතා පාරිතෝෂික	35	9.71	-	0.7		35	10.41
අර්ධ අබලතා පාරිතෝෂික	73		02			75	
පූර්ණ අබලතා මාසික දීමනා	27		27			54	

III. "ආරක්ෂාව" පූර්ව සැලසුම් යෝජනා ක්‍රමයේ අතිරේක ප්‍රතිලාභ ගෙවීම

විස්තරය	**1996.01.01 සිට 2020.12.31 දක්වා එකතුව**		**2021.01.01 සිට 2021.12.31 දක්වා එකතුව**		**2021.12.31 දක්වා එකතුව**	
	සංඛ්‍යාව	වටිනාකම (රු.මිලි.)	සංඛ්‍යාව	වටිනාකම (රු.මිලි.)	සංඛ්‍යාව	වටිනාකම (රු.මිලි.)
5 වසර ශිෂ්‍යත්ව විභාගය	1248	12.36	342	31	1590	43.36
අ.පො.ස.(සා.පෙළ) විභාගය						
අ.පො.ස.(උ.පෙළ) විභාගය						
ශුද්ධ දායක මුදල් ගෙවීම						

2021.01.01 සිට 2021.12.31 දක්වා පවත්වනු ලැබූ සංවර්ධන වැඩසටහන්

I. පෞද්ගලික බස් රථ රියදුරු හා කොන්දොස්තර මහතුන් සඳහා විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වාදීම

II. 2021.04.20 දින පැවති බුදුපුත් මාපිය හරසර වැඩසටහන

III. "කලාකරු" දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වාධීන රූපවාහිනී සේවයේ නියුතු නිලධාරීන් වෙනුවෙන් හඳුන්වාදීම

IV. "සෞභාග්‍යා සතිය 03" වෙනුවෙන් නාවිකයින් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම

V. රාජ්‍ය නොවන සංවිධාන (NGO) හා ඒකාබද්ධව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ප්‍රවර්ධනය

VI. 2021 සේවක අභිප්‍රේරණ වැඩසටහන

VII. සමාජ ආරක්ෂණ රැකවරණය සහිතව තරුණ ප්‍රජාව ස්වයං රැකියා සඳහා දිරිමත් කිරීමේ වැඩසටහන

VIII. දේවාල කාර්ය මණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හඳුන්වා දීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සඳහා වාර්ෂික අයවැය මඟින් මුදල් ප්‍රතිපාදන වෙන්වීමක් සිදු නොවන අතර සියලුම ප්‍රාග්ධන වියදම්, පුනරාවර්තන වියදම් හා සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන බැංකු ආදායමෙන් වැය කරනු ලබයි.

ලබා දුන් ණය ප්‍රමාණය හා ප්‍රතිලාභින් ප්‍රමාණය

ණය වර්ගය	ලබා දුන් ණය මුදල (රු.මි)	**ප්‍රතිලාභින් ගණන**
වගා ණය	4,628.64	47,979
කෘෂිකාර්මික ණය	10,286.73	49,264
කෘෂි උපකරණ	532.31	4,663
ඖඩපන ණය	180.48	24
පාරිභෝගික ණය	17,430.87	25,465
වාණිජ ණය	20,364.03	98,406
ධීවර කර්මාන්තය	1,435.45	6,771
නිවාස ණය	233.37	304
කාර්මික ණය	9,576.39	16,383
පශු කර්මාන්ත ණය	4,635.62	64,776
අනෙකුත් ණය	50,083.97	628,568
එකතුව	**11,9387.86**	**942,603**

විශේෂ ජයග්‍රහණ

I. පැලියගොඩ නව මැනිං වෙළඳ සංකීර්ණයේ සේවා මධ්‍යස්ථානයක් 2021.01.15 දින පිහිටුවීම.

II. "RDB සිත්තම් පැංචා" චිත්‍ර තරගය ලෝක ළමා දිනයට සමගාමීව ළමුන් වෙනුවෙන් හඳුන්වා දෙන ලදී. මේ තුලින් RDB කැකුළු ගිණුම ප්‍රවර්ධනය අරමුණු කරන ලදී.

III. හොඳම ව්‍යවසායිකාව තේරීමේ "දිරි අභිමානී" වැඩසටහන ක්‍රියාත්මකකිරීම .

IV. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සහ ගැනුම්කරුවන් සඳහා පහසුකම් සපයන online සේවාවක් seilama.lk නමින් දියත් කිරීම.

V. රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන්නාවූ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ගනුදෙනුකරුවන් ප්‍රමුඛ සියලු තැනැත්තන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ හඳුන්වා දීම සඳහා සමාජ ආරක්ෂණ මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.

VI. QR පහසුකම වෙළඳ ප්‍රජාව සඳහා හඳුන්වා දීම.

VII. විශ්‍රාමිකයින් සඳහා ඇගිලි සලකුණු ලබා ගැනීමේ යන්ත්‍ර 20 ක් අපගේ ශාඛා 20 ක පිහිටු වීම.

VIII. "සෞභාග්‍යා සතිය" තුල විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.

IX. RDB ජංගම බැංකු රථය මගින් COVID 19 කාල සීමාව තුල අපහසුතාවයට පත් වූ පුද්ගලයන් සඳහා ඔවුන්ගේ නිවාස ආසන්නයට බැංකු සේවා සපයන ලදී.

ඉදිරි ඉලක්ක

I. ATM හා CDM පහසුකම් වලින් සමන්විත Smart Centre 20 ක් පිහිටුවීම

II. නව බැංකු ශාඛා 6 ක් උතුරු ප්‍රදේශය ඇතුලත්ව පිහිටුවීම

III. එක් ග්‍රාම නිලධාරී වසමකට එක් අයෙකු බැගින් නව ව්‍යවසායකයින් 15,000 ක් ගොඩනැගීම.

IV. QR පහසුකම සියලු ගනුදෙනුකරුවන් සඳහා හඳුන්වා දීම

V. සක්‍රීය ගනුදෙනුකරුවන් ප්‍රමාණය මිලියන 2.9 දක්වා වර්ධනය කිරීම.

VI. තැන්පතු කලඹ රු. බිලියන 219 දක්වා වර්ධනය කිරීම. තැන්පතු (ඉතුරුම් හා ස්ථාවර තැන්පතු) අනුපාතය 39: 61 ලෙස පවත්වා ගැනීම.

VII. ණයකලඹ රු. බිලියන 216 දක්වා වර්ධනය කිරීම.

VIII. Debit Card පහසුකම හඳුන්වා දීම.

IX. පහත සඳහන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය

- තරුණ ව්‍යවසායකයින් 10,000 ගොඩනැගීම
- කාන්තා ව්‍යවසායිකාවන් 10,000 ක් ගොඩනැගීම.
- ධීවර ණය ලබා දීමේ වැඩසටහන

- හොඳම ව්‍යවසායිකාව තේරීමේ දිරි අභිමානී 2022 වැඩසටහන මගින් ව්‍යවසායිකාවන් දිරිමත් කිරීම
- කිරි ශක්ති වැඩසටහන
- තුරුණු දිරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම

X. ව්‍යවසායකයින් සඳහා ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම තුලින් ඔවුන්ගේ වෙළඳපොල අවස්ථා ප්‍රවර්ධනය කිරීම .

XI. ශාඛා මට්ටමින් හොඳම ගනුදෙනුකරුවන් තෝරා ඔවුන් ඇගයීමේ වැඩසටහන් පැවැත්වීම.

XII. ජංගම බැංකු රථය මගින් දුෂ්කර ප්‍රදේශ වල ජීවත්වන පුද්ගලයින් හට බැංකු පහසුකම් සැපයීම

XIII. විදේශ මුදල් හුවමාරු කිරීමේ කටයුතු ආරම්භ කිරීම .

XIV. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ හා පිටකොටුව පාවෙන වෙළඳපොලෙහි සේවා කවුළුවක් පිහිටුවීම.

XV. පාසල් සිසුන් (වයස අවුරුදු 15 ට වැඩි) සහ පාසල් හැරයන සිසුන් සඳහා බැංකුව හා සම්බන්ධ විශේෂ වැඩසටහන යටතේ පාසල් ජංගම බැංකු සේවා සපයා අනාගත ගනුදෙනුකරුවන් සකස් කර ගැනීම සහ වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා පාසල් හැරයන සිසුන් යොමු කිරීම.

අභියෝග

I. නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට හා පවත්නා වෙළඳපොල කොටස පවත්වා ගැනීම සඳහා මුල්‍ය වෙළඳපොලෙහි පවත්නා තරගකාරිත්වය

II. ග්‍රාමීය ප්‍රදේශ වල ක්ෂුද්‍ර හා සුළු පරිමාන ව්‍යවසායකයින් අත්පත් කර ගැනීම සඳහා ක්ෂුද්‍ර මුල්‍ය ආයතන විශාල බලපෑමක් ඇති කරනු ලබයි. නමුත් ක්ෂුද්‍ර මුල්‍ය ක්ෂේත්‍රය අවිධිමත් ක්ෂුද්‍ර මුල්‍ය ආයතන නිසා අපහසුතාවයන්ට පත් වී ඇත.

III. ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ඉහල පිරිවැයක් දැරිය යුතු වීම.

IV. බලපත්‍රලාභී විශේෂ බැංකුවක් ලෙස වාණිජ බැංකු වලට සාපේක්ෂව තැන්පතු රාශිකරණය සඳහා පිරිවැය ඉහල යාම.

V. ඉලක්ක වෙළඳ පොලෙහි මුල්‍ය සාක්ෂරතාවය අවම වී තිබීම.

VI. කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාවය අඩු වීම නිසා ගොවීන් අතර නව හා සුදුසු තාක්ෂණ ක්‍රම පිලිබඳව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කල යුතු වීම.

VII. COVID 19 බලපෑම මත ආර්ථිකයේ සිදු වී ඇති බලාපොරොත්තු නොවූ අපහසුතාවයන් මත ඇතිවූ අවහිරතා.

රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව

රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථා සමාගමේ වර්තමාන තත්වය හා දැනට අවසන් කර ඇති කාර්යන්

I. එම සමාගම සතුව 2021.07.15 දිනට රු. 1,521,370.78 ක බැංකු හර (වාසි සහගත) ශේෂයක් හා වර්තමාන වටිනාකම රු 61,928,356.90 ස්ථාවර තැන්පතුවක් ඇත.

II. සී/ස රබර් අපනයන සංස්ථාවට හිමිකාරත්වය ඇති කළමනාකාරීත්වය පමණක් මෙම සංස්ථාවට පැවරුණු වත්කම් 03 ක් (ඉඩම් ගොඩනැගිලි) ඇරෝමා නැවුරල් රබර් පුද්.සමාගමට 30 අවුරුදු බදු ගිවිසුමක් යටතේ බද්දට දී ඇත.

III. එම වත්කම් 03 න් වසරකට රු.10,849,164 ක බදු ආදායමක් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට හිමි වේ. එමෙන්ම 2021.04.15 දක්වා සියළු බදු කුලී ඇරෝමා නැවුරල් රබර් පුද්.සමාගමෙන් අය කර ගෙන ඇත.

IV. එමෙන්ම බදු පදනම මත මෙතෙක් කිසිවෙකුට නොපැවරූ ඇල්පිටිය ඉඩම හා එහි ඇති අඩි 150*300ක ගොඩනැගිල්ලක් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව සතු වේ. එම කර්මාන්ත ශාලාව වසර 20 ක කාලයක් පුරා වසා දමා ඇත.

V. ඇල්පිටිය කර්මාන්තශාලාවේ දැනට පවතින තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම්ගේ සහභාගීත්වයෙන් මෙම අමාත්‍යාංශ ලේකම් උපදෙස් පරිදි අතිරේක ලේකම්(සංවර්ධන), ප්‍රධාන මූල්‍ය නිලධාරී, ගණකාධිකාරී (ගෙවීම්) හා විෂය භාර නිලධාරී සහභාගීත්වයෙන් 2021.07.08 දින එම කර්මාන්තශාලා වල නිරීක්ෂණ චාරිකාවක යෙදින ලදී.

VI. එම චාරිකාවේදී මෙම භූමිය විවිධ අකටයුතු ක්‍රියාකාරකම් වල යෙදෙන බව ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් මඟින් දැනගන්නා ලදී. එබැවින් මේ සඳහා ක්ෂණික පියවරක් වශයෙන් ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම්ගේ අධීක්ෂණය යටතේ සුදුසු ඇස්තමේන්තුවක් මත පූර්ණ ගොඩනැගිලි භූමිය අළුත් වැඩියා කිරීමටත් ඒ සඳහා සුදුසු ආරක්ෂිත වැඩ පිළිවෙලක් යෙදීමටත් අවශ්‍ය මුදල් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට අනුමැතිය ඉල්ලා මුදල් අමාත්‍යාංශය වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී.

VII. එම ලිපියට පිළිතුරු වශයෙන් PED/P/SRMC/1/11 (i) අංක දරණ 2021.09.10 දිනැති ලිපි පිටපතෙහි සඳහන් පරිදි දැනට අක්‍රීයව පවතින සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව නැවත ආරම්භ කිරීම මහා භාණ්ඩාගාරයට අතිරේක වැය බරක් වන බැවින් කඩිනමින් ඈවර කරන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත උපදෙස් දී ඇති බව සඳහන් වේ.

VIII. රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට අයත් වත්කම් වගකීම් පිළිබඳ වාර්තා නීතිමය වශයෙන් තහවුරු කර ගැනීමට ලිඛිත ලියවිලි මෙම අමාත්‍යාංශය සතුව නොමැත.

IX. එමෙන්ම සමාගමක් ඇවර කිරීමේ ක්‍රියාවලිය දැඩි නීතිමය ස්වරූපයක් ගන්නා බැවින් හා සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවේ සියළු අධ්‍යක්ෂ මණ්ඩලය මේ වන විට ඉල්ලා අස්වී ඇති බැවිනුත් හා සාංගමික ව්‍යවස්ථාවලියට අනුව සියළු කොටස් අයිතිය මහා භාණ්ඩාගාරය සතුව පවතින බැවින්ද තීරණ ගැනීමේ බලතල සියල්ල මහා භාණ්ඩාගාරයට පැවරී ඇත. එම නිසා ඉහත කාරණා සියල්ල සලකා බැලීමෙන් අනතුරුව රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව ඇවර කිරීමේ කටයුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර නීති දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කිරීමට හැකි නම් එය වඩාත් යෝග්‍ය බව යෝජනා කරමින් මේ සම්බන්ධව උපදෙස් ඉල්ලා මෙම අමාත්‍යාංශ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශය වෙත 2021.09.27 දින ලිපියක් ඉදිරිපත් කරන ලදී

X. ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් විසින් SRMC ට එරෙහිව කොළඹ වාණිජ මහ අධිකරණයේ නඩු අංක CHC/569/17/MR අංක දරණ නඩුවක් ගොනුකර ඇති අතර එම නඩුකරය සම්මුති ක්‍රමවේදයක් යටතේ විසඳා ගැනීමට කටයුතු කරන මෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් මෙම අමාත්‍යාංශය වෙත දන්වා ඇත. ඒ අනුව එම නඩුකරය සමතයකට පත්කර ගැනීමට දායකත්වය ලබාදෙන මෙන් හා ඒ සම්බන්ධ අදහස් ඉල්ලා කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් අත්සනින් යුතුව ලිපියක් ඉදිරිපත් කර ඇත.

විදේශ අරමුදල් මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති

විදේශ අරමුදල් මඟින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණය සැලසුම් හා මෙහෙයුම් අංශය මඟින් සිදුකරයි.

ව්‍යාපෘති අංක 01	**ශ්‍රී ලංකා කොවිඩ් -19 හදිසි ප්‍රතිචාර සෞඛ්‍ය පද්ධතිය - පෙර සූදානම් ව්‍යාපෘතිය - අතිරේක මුදල් සැපයීම**
අරමුදල් ප්‍රභවය	ලෝක බැංකු අරමුදල්
ක්‍රියාත්මක කළ ස්ථානය	දිපව්‍යාප්තව
ඉලක්කගත කණ්ඩායම	කොවිඩ් 19 වසංගතයේ බලපෑමට ලක්වූවන්
කාල රාමුව	2020 – 2023
වෙන් කළ මුදල	ඇමරිකානු ඩොලර් මිලි. 87.24 (කොවිඩ් බලපෑමට ලක්වූ පවුල් සඳහා මූල්‍යමය හා සාමාජීය සහන සැලසීම වෙනුවෙන් අතිරේක මුදල් සැපයීම)
2021.12.31 දිනට වියදම	කොවිඩ් - 19 හේතුවෙන් බලපෑමට ලක් වූ පවුල් සඳහා රු.5000/= ආධාරය ගෙවීම වෙනුවෙන් 2020 හා 2021 කාලය තුළ සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය හරහා රු. මිලි. 6,017.85ක මුදලක් වැය දරා ඇත.
ව්‍යාපෘති අංක 02	**සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය**
අරමුදල් ප්‍රභවය	ලෝක බැංකු අරමුදල්
ක්‍රියාත්මක කළ ස්ථානය	දිප ව්‍යාප්තව

ඉලක්කගත කණ්ඩායම	අඩු ආදායම්ලාභී පවුල්
කාල රාමුව	2017 – 2022
වෙන් කළ මුදල	ඇමරිකානු ඩොලර් මිලියන 75
2021.12.31 දිනට වියදම	මුදල් අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ව්‍යාපෘති කාර්යාලය මඟින් වියදම් දරයි

සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 2 ක් කේන්ද්‍ර කර ගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් හා ආශ්‍රිත ගම්මාන බලසම්පන්න කිරීමේ වැඩසටහන

ව්‍යාපෘතිය පිළිබඳ මූලික හැඳින්වීම: - රට හදන සෞභාග්‍යයේ දැක්මේ "එලදායී පුරවැසියෙක් සතුටින් ජීවත්වන පවුලක්" යන ප්‍රමුඛ සංකල්පය යථාර්ථයක් බවට පත්කර ආර්ථික, සමාජයීය හා පාරිසරිකව සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීම සඳහා ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ රජයේ ප්‍රමුඛ වැඩපිළිවෙළට සමගාමීව,තිරසර පරිභෝජනය හා ආදායම් උත්පාදනය මූලික කරගත් "අංගසම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් හා ආශ්‍රිත ගම්මාන බල සම්පන්න කිරීමේ වැඩසටහන" මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලදී.

මෙම වැඩපිළිවෙළ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තුළින් ගෘහ ඒකකය තුළ තිරසර පරිභෝජනයට ජනතාව හුරුකර, නිවසේ ආදායම හා වියදම මනා කළමනාකරණයකින් යුක්තව පවත්වා ගැනීමත් තම අතිරික්ත නිෂ්පාදනය ග්‍රාමීය වෙළෙඳපොළට යොමු කිරීම මඟින් නිවසේ ආර්ථිකය ශක්තිමත් කිරීමක් අපේක්ෂා කරන ලදී.

මෙම ජාතික වැඩසටහනේ ප්‍රධාන සංචරකයක් ලෙස ගෘහ ආර්ථිකය දියුණු කිරීමට ප්‍රමුඛතාවය දෙමින් යල හා මහ කන්න මූලික කරගත් ගෙවතු වගා වැඩසටහන ඇතුළුව ක්ෂේත්‍ර 05 ක් ආවරණය කරමින් තිරසාරව සමෘද්ධි ප්‍රතිලාභී පවුල් ලක්ෂ දෙකක් (200,000 ක්) සවිබල ගැන්වීමට අපේක්ෂා කරන ලදී.

2021.12.31 දිනට ප්‍රගතිය

මූල්‍ය ප්‍රගතිය - රු. මිලි. 10,000 ක ප්‍රතිපාදන වෙන් වූ අතර රු.මි. 5,750.00 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මඟින් ලබා දී ඇත.ඒ අනුව, 2021.12.31 දිනට අතැති බිල්පත් වල වටිනාකම රු. මිලියන 739.78 කි. සත්‍ය වියදම රු.මිලියන 3,533.50 කි.

භෞතික ප්‍රගතිය - මෙම වැඩසටහන අංශ 2 ක් යටතේ ක්‍රියාත්මක වේ.

I. සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 2 ක් සවිබල ගැන්වීම

ග්‍රාම නිලධාරී වසමකට අවම වශයෙන් ප්‍රතිලාභීන් 15 ක් වන පරිදි වසම් මට්ටමින් සවිබලගැන්විය හැකි සමෘද්ධි/ අඩුආදායම්ලාභී ප්‍රතිලාභී පවුල් හඳුනා ගෙන, ඔවුන් දැනටමත් නියැලෙන ආදායම් උත්පාදන ව්‍යාපෘතින් තවදුරටත් වර්ධනය කර ගැනීමට හා මාසික ආදායම වැඩිදියුණු කර ගැනීමට

හැකි වන පරිදි සහාය සේවා ආයතනයන් හි දායකත්වයද ලබා ගනිමින් ප්‍රතිලාභීන් ව්‍යාපෘති ගැන්වීමට කටයුතු කරන ලදි. මෙහිදි CRM පරිගණක මෘදුකාංගය හරහා ව්‍යාපෘතිලාභි තොරතුරු හා ප්‍රගතිය ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරන ලදි. මෙහිදී කෘෂිකර්ම, සත්ව පාලන, ධීවර, කර්මාන්ත, වෘත්තීය පුහුණු, අලෙවි වශයෙන් ව්‍යාපෘති 76,587 ක් ක්‍රියාත්මක කර ඇත.

II. තෝරා ගත් සමෘද්ධිලාභි පවුල් ලක්ෂ 2 ක් ඇතුලත්ව ගෙවතු 1,000,000 සංවර්ධනය කිරීම ප්‍රතිලාභී පවුල්වල පෝෂණය ඉහළ නැංවීම සඳහා ජාතික ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ යටතේ;

- ඒ ඒ දිස්ත්‍රික්කයන්ට සුදුසු පලතුරු පැල හා අපනයන කෘෂිකර්මයට අදාළ පැල වර්ග සමෘද්ධිලාභී පවුල් 1,000,000කට ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ එළවළු බීජ පැකට් 756,859 ක් ප්‍රතිලාභීන් 756,848 ක් සඳහා ද පලතුරු පැල 1,117,126 ක් ප්‍රතිලාභීන් 698,482 ක් සඳහා ලබා දී ඇත.
- වසමකින් තෝරා ගත් සමෘද්ධිලාභී පවුල් 3 ක් වන පරිදි සමෘද්ධිලාභී පවුල් 31,656කට කුකුළු පැටවුන් 280778 ලබාදී ඇත.
- පොල් වගා කිරීමේ මණ්ඩලය වෙතින් සමෘද්ධි ප්‍රතිලාභීන් 1,000,000ක් සඳහා පොල් පැලයක් බැගින් ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ මේ වන විට පොල් පැල 238,299 ක්ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතියෙන් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ: -

- අංගසම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සහිතව අඩු ආදායම්ලාභී පවුල් සවිබලගැන්වීම
- විකල්ප ආදායම් මාර්ග ඇති කිරීම
- වෙළඳපළ ජාලය ශක්තිමත් කිරීම මගින් දේශීය නිෂ්පාදන ප්‍රවලිත කිරීම
- ව්‍යවසාය සංවර්ධනය මගින් විරැකියාව අඩුකිරීම
- නිෂ්පාදන ගම්මාන ඇති කිරීම මගින් විශේෂිත නිෂ්පාදන දිරිමත් කිරීම
- වසවිසෙන් තොර ආහාර නිෂ්පාදනය වැඩිකර ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
- අවිධිමත් ණය සඳහා යොමුවීම අඩුකර සහනදායී පොලී අනුපාතයන් යටතේ ණය ලබා දීම
- පරිසර හිතකාමී ජීවන රටාවකට ජනතාව හුරු කිරීම.
- ශාරීරික හා මානසිකව නිරෝගී අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය වූ ප්‍රජාවක් බිහිකිරීම.

.....
ප්‍රධාන ගණුන් දීමේ නිලධාරි
නම :-
තනතුර :-
දිනය :- 2022 06 16

නීල් ඔණ්ඩාර හපුආච්චි
මෙක්සම්
කාන්තා, ළමා යටඉපුතු හා සමාජ
සවිබලගැන්වීම් අමාත්‍යාංශය
01 වන මහල, පෙත්සිරිගාය - අලුවිහාර
ඒ: අංක්‍රියාව.

39

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
කාර්ය සාධන වාර්තාව 2021

පරිච්ඡේදය 03 – 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1.මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒ සී ඒ - එෆ්

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය 2021		සටහන	තත්‍ය		
			වර්ථමාන වර්ෂය	නැවත ගලපන ලද	
			2021	**2020**	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	**1**	නැත	නැත	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	නැත	නැත	**ඒසිඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	නැත	නැත	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	නැත	නැත	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		නැත	නැත	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		585,115,000	526,972,639	**ඒසිඒ-3**
-	තැන්පතු		2,774,467	13,193,843	**ඒසිඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		15,613,973	24,751,602	**ඒසිඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	10,848,622	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**603,503,440**	**575,766,706**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**603,503,440**	**575,766,706**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		(5,763,205)		
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ =(ඇ)-(ඈ)		597,740,235		
	අඩුකළා : වියදම්				
7,464,800,000	**පුනරාවර්තන වියදම්**				
280,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	253,921,427	235,985,212	
206,950,000	අනෙකුත්භාණ්ඩ හා සේවා	**6**	189,569,819	167,782,083	**ඒසිඒ 2(ii)**
6,977,300,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	6,891,660,011	6,305,875,127	
-	පොළී ගෙවීම්	**8**			

50,000	වෙනත් පුනරාවර්තන වියදම්	**9**			
7,464,800,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**7,335,151,257**	**6,709,642,422**	
	මූලධන වියදම්				
10,750,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	8,387,962	4,275,637	
251,150,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	123,136,547	130,345,065	
80,000,000	ප්‍රාග්ධන මාරු කිරීම්	**12**	69,551,098	52,336,674	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**		-	ඒසිඒ- (ii)
1,700,000	හැකියා වර්ධනය	**14**	718,155	1,076,275	
11,115,000,000	වෙනත් මූලධන වියදම්	**15**	6,492,900,836	535,801,942	
11,458,600,000	**මුළු මූලධන වියදම් (උ)**		**6,694,694,598**	**723,835,594**	
	තැන්පතු ගෙවීම්		2,823,923	4,999,220	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		14,843,681	70,894,121	ඒසිඒ-5/5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්				
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		17,667,604	75,893,341	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**14,047,513,459**	**7,509,371,357**	
	2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)		**(13,449,773,224)**	**(6,933,604,651)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(13,449,773,224)**		ඒසිඒ-7 ඒසිඒ-3
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**-**		
			(13,449,773,224)		

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒ සී ඒ - පී

2021.12.31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන		තත්‍ය	
			2021 (රු.)	2020(රු.)
මූල්‍ය නොවන වත්කම්				
දේපළ පිරියත හා උපකරණ	ඒසීඒ-6		1,094,223,666	1,008,272,864
මූල්‍ය වත්කම්				
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)		51,683,324	52,453,617
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3			2,241,772
මුළුවත්කම්			**1,145,906,990**	**1,062,968,253**
ශුද්ධ වත්කම් / ස්කන්ධය				
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්			(1,708,496)	(987,659)
දේපළපිරියත හා උපකරණ සංචිතය			1,094,223,666	1,008,272,864
කුලීහා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)			
ජංගම වගකීම්				
තැන්පතු ගිණුම්	ඒසීඒ-4		53,391,820	53,441,276
අග්‍රිම ශේෂය	ඒසීඒ-3			2,241,772
මුළු වගකීම්			**1,145,906,990**	**1,062,968,253**

පිටු අංක 01 සිට 50 දක්වා ඒසීඒ එෆ්සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍ර වලින ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 51 සිට 68 දක්වා ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊටඅදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2022.06.16

නිල් බණ්ඩාර හපුහින්න
ලේකම්
කාන්තා, ළමා කටයුතු හා සමාජ
සවිබලගැන්වීම් අමාත්‍යාංශය
01 වන මහල, සෙත්සිරිපාය - අදියර II

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූල්‍ය) / කොමසාරිස් (මූල්‍ය)
නම :
තනතුර :
දිනය : 2022.05.24

R.A.W. Vikramasingha
Chief Financial Officer
State Ministry of Samurdhi, Home Economy,
Microfinance and Self-Employment
1st Floor, Sethsiripaya Stage II,
Battaramulla.

42

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
කාර්ය සාධන වාර්තාව 2021

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ - පී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	2021 (රු.)	**2020 (රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		නැත
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		නැත
ලාභ		නැත
ආදායම් නොවන ලැබීම්		10,848,622
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	11,981,295	-
අග්‍රිම ලැබීම්	585,115,000	526,972,639
අත්තිකාරම් අයකර ගැනීම	15,774,774	14,605,406
තැම්පතු ලැබීම්	2,774,467	13,193,843
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල්ප්‍රවාහය (අ)	**615,645,536**	**565,620,510**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	321,406,134	240,225,976
සහනාධාර සහ මාරුකිරීම්	19,790,700	
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,907,343	50,857,340
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	5,763,205	14,672,268
තැන්පතුගෙවීම්	2,823,923	4,999,220
අත්තිකාරම් ගෙවීම්	14,843,681	9,372,330
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**366,534,986**	**320,127,134**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**249,110,550**	**245,493,376**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල්ප්‍රවාහයන්		
පොළී	නැත	නැත
ලාභාංශ	නැත	නැත
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම්විකිණීම	නැත	නැත
උපණය අයකර ගැනීම්	නැත	නැත
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	249,110,550	245,493,376

ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**249,110,550**	**254,865,706**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් (ඊ)=(ඇ)-(ඉ)	**(249,110,550)**	**(254,865,706)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	**(9,372,330)**
<u>මූල්‍ය ක්‍රියාකාරක වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	නැත	නැත
විදේශීය ණය ගැනීම්	නැත	නැත
ප්‍රදානයන් ලැබීම්	නැත	නැත
මූල්‍ය ක්‍රියාකාරක වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	නැත	නැත
විදේශීය ණය ආපසු ගෙවීම්	නැත	නැත
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	**(9,372,330)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	-	**(9,372,330)**
ජනවාරි **01** දිනට ආරම්භක මුදල් ශේෂය	නැත	නැත
දෙසැම්බර් **31** දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන- අදාල නොවේ

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය- අදාල නොවේ

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	7,459,800,000	7,464,800,000	7,335,151,256	98.26
ප්‍රාග්ධන	5,703,600,000	11,458,600,000	6,694,694,598	58.43

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	දුම්රිය දෙපාර්තමේන්තුව	වොරන්ට් බලපත්‍ර 414-1-2-0-1003	162.16	162.16	162.16	100
02	රජයේ මුද්‍රණාලය	මුද්‍රණ කටයුතු	46.289	46.289	46.289	100
03	ජාතික සමාජ සංවර්ධන ආයතනය	රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම්- පුද්ගල පඩි නඩි - 414-1-2-1-1503	90,000	90,000	80,300	89.22
04	සමාජ ආරක්ෂණ මණ්ඩලය	රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් පුද්ගල පඩි නඩි- 414-1-2-2-1503	96,000	96,000	96,000	100
05	ජාතික සමාජ සංවර්ධන ආයතනය	රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම්- අනෙ. පුනරාවර්තන -414-1-2-1-1509	57,000	57,000	27,200	47.71
06	සමාජ ආරක්ෂණ මණ්ඩලය	රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් - අනෙ. පුනරාවර්තන 414-1-2-2-1509	44,000	44,000	29,609	67.29
07	ජාතික සමාජ සංවර්ධන ආයතනය	රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම්- ප්‍රාග්ධන 414-1-2-1-2201	10,000	10,000	5,600	56
08	සමාජ ආරක්ෂණ මණ්ඩලය	රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් - ප්‍රාග්ධන 414-1-2-2-2201	15,000	15,000	13,000	86.66
09	දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා	උපදේශන නිලධාරීන් සඳහා වැටුප් ගෙවීම 414-2-7-0-1001	94,494.909	94,494.909	90,855.322	96.14
10	දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා	උපදේශන නිලධාරීන් සඳහා ජීවන වියදම්	27,784.258	27,784.258	27,251.890	98.08

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
		දීමනාව 414-2-7-0-1003				
11	දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා	උපදේශන නිලධාරීන් සඳහා ගමන් වියදම් 414-2-7-0-1101	5,082.365	5,082.365	3,254.655	64.03
12	දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා	උපදේශන නිලධාරීන් සඳහා ලිපි ද්‍රව්‍ය දීමනා 414-2-7-0-1201	470.4	470.4	469.958	99.90
13	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා	තැපල් හා සංනිවේදන 414-2-7-0-1402	26.87	26.87	23.992	89.26
14	ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා	විදුලිය සඳහා 414-2-7-0-1403	21.2	21.2	20.847	98.33
15	දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා	ආබාධිත පුද්ගලයන් සඳහා රු.5000/- දීමනාව 414-2-7-1-1501	4,320,000	4,320,000	4,311,336.582	99.79
16	දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා	චකුගඩු රෝගීන් සඳහා මූල්‍යාධාර ලබාදීම 414-2-7-4-1501	2,349,000	2,349,000	2,326,075.5	99.02
17	දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා	උපදේශන නිලධාරීන් සඳහා දේපල ණය පොළී සඳහා ජරයේ දායකත්වය 414-2-7-0-1506	1,974.889	1,974.889	1,353.229	68.52
18	දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා	උපදේශන වැඩසටහන් 414-2-7-8-2509	8,544.446	8,544.446	8,337.028	97.57
19	දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා	සෞභාග්‍ය වැඩසටහන 414-2-3-3-2509	4,796,150.451	4,796,150.451	2,821,380.513	58.82

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
20	විසිතුරු මසුන්, මිරිදිය මතස්‍ය හා ඉස්සන් ඇත්කිරීම, ධීවර වරාය සං. බහුදින යි.ක. හා මතස්‍ය අපනයන රා.අමාත්‍යාංශය	සමෘද්ධි පවුල් ලකෂ 2 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන 414-2-3-4-2509	270,000	270,000	269,881.979	99.95
21	ආයුර්වේද දෙපාර්තමේන්තුව	සමෘද්ධි පවුල් ලකෂ 2 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන 414-2-3-4-2509	3,600	3,600	1,111.164	30.86
22	පොල් කිතුලූ හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නි. හා අපනයන වි. රා. අමාත්‍යාංශය	සමෘද්ධි පවුල් ලකෂ 2 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන 414-2-3-4-2509	285,000	285,000	285,000	100
23	සමාගම් වතු ප්‍රති., තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්ත ශාලා නවීකරණ හා තේ හා රබර් අප. ප්‍ර. රා. අමාත්‍යාංශය	සමෘද්ධි පවුල් ලකෂ 2 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන 414-2-3-4-2509	50,000	50,000	50,000	100
24	සමෘද්ධි සං. දෙපර්තමේන්තුව	සමෘද්ධි පවුල් ලකෂ 2 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන 414-2-3-4-2509	49,582.251	49,582.251	42,117.219	84.94
	දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා	සමෘද්ධි පවුල් ලකෂ 2 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන 414-2-3-4-2509	5,091,817.749	5,091,817.749	2,949,156.146	57.91

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේතය	**31.12.2021** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2021** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	710,296,158.39	589,293,499.48		
9152	යන්ත්‍රෝපකරණ	383,927,507.82	418,979,363.61		
9153	ඉඩම්	නැත	නැත		
9154	අස්පෘශ්‍ය වත්කම්	නැත	නැත		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	නැත	නැත		
9160	කෙරීගෙන යන වැඩ	නැත	නැත		
9180	බදු දෙන ලද වත්කම්	නැත	නැත		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව*



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. LSW/A/SMS/13/2021/FA
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2022 මැයි 19 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිකෙරෙමින් පවතින සීදුව පුහුණු මධ්‍යස්ථානයට අදාළ ගොඩනැඟිල්ල සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. 121,002,659 ක් වැය කිරීම, මූල්‍ය නොවන වත්කම් වල නිවාස නොවන ගොඩනැඟිලි යටතේ, මීලදී ගැනීම් ලෙස දක්වා තිබුණි.

(ආ) අමාත්‍යාංශයට අයත් පිළිමතලාවේ සහ බොරැල්ල පිහිටි පර්යේෂණ හා පුහුණු ආයතනයේ ඉඩම් ගොඩනැඟිලි වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වත්කම් වර්ග 4 කට අයත් අයිතම 77 ක වටිනාකම රු. 3,815,643 ක් නිවැරදි වත්කම් වර්ගීකරණය යටතේ ගිණුම්ගත නොකොට පරිගණක උපාංග ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) වර්ෂය ආරම්භයේ රු. 589,293,499 ත්වූ කාර්යාල ගොඩනැඟිලි ශේෂය තුළ සමාජ ආරක්ෂණ මණ්ඩල ගොඩනැඟිලි ඉදිකිරීම් වටිනාකම රු. 540,000 ක්ද ඇතුළත්ව තිබුණි.

(ඉ) 2021 මාර්තු 26 දින අපහරණ කමිටුව විසින් හදුනාගන්නා ලද වාහන 5 ක් දෙසැම්බර් මාසයේ වෙනත් ආයතනවලට පවරා දී තිබුණද ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර නොතිබුණි.

(ඊ) අමාත්‍යාංශය සතු වත්කම් වලින් පිරිවැය රු. 6,626,616 ක් වූ අයිතම 15 කට අදාළ භාණ්ඩ ඒකක 144 ක් වර්ෂය තුළ අපහරණයකල ලෙස ACA 6 හි දක්වා තිබුණද භාණ්ඩ අපහරණය ලැයිස්තුවට අනුව අයිතම 54 කට අදාළ භාණ්ඩ ඒකක 259 ක් අපහරණය කර තිබුණි.

1.6.1.2 අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සාමාජික ණය ලේඛනයේ නිලධාරීන් 7 දෙනෙකුට අදාළ රු. 1,680,826 ක්වූ ණය ශේෂය ගිණුම් සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛනයට ඇතුළත්ව නොතිබූ අතර නිලධාරීන් 7 දෙනෙකුට අදාළ රු. 1,362,971 ක්වූ ණය ශේෂ එකතුව ගිණුම් සමඟ ඉදිරිපත් වූ උපලේඛනයේ ඇතුළත්ව ඇතත් සාමාජික ණය ලේඛනයට ඇතුළත්ව නොතිබුණි.

(ආ) 2022 ජනවාරි 03 දින පැවැත්වීමට නියමිතව තිබූ 2021 වසරේ සංවර්ධන ප්‍රගති සමාලෝචන රැස්වීමට අදාළ සංග්‍රහ කටයුතු වෙනුවෙන් ඉදිරිපත් කල ඇස්තමේන්තුවට අනුව රු. 61,400 ක් අත්තිකාරම් ලෙස ලබා නොදී සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.6.1.3 අග්‍රිම ගිණුම

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති අග්‍රිම ගිණුමේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ACA – 3 හි අග්‍රිම ගිණුම් අංකය 7002-0-0-324-21 ලෙස සටහන් විය යුතු වුවත් අංක 7002-0-0-324-19 ලෙස වැරදි ලෙස සටහන් කර තිබුණි.

(ආ) භාණ්ඩාගාර මුද්‍රිත SA-70 ප්‍රකාරව 7002-0-0-324-20 අග්‍රිම ගිණුමේ පෙර වර්ෂයේ රු. 2,241,771 ක ආරම්භක ශේෂය ACA – 3 ආකෘතියට ඇතුළත් කර නොතිබුණි.

1.6.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු. 5,959,850 ක්වූ වැටුප්, දීමනා, අතිකාල, ඉන්ධන දීමනා ගෙවීම 414-1-2 වැඩසටහන යටතේ දැක්විය යුතු වුවත් 414-1-1 වැඩසටහන යටතේ දක්වා තිබුණි.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි ඉදිරිපත් කරන ලද ආකෘතියෙහි නැවත ගලපන ලද ශේෂ ඇතුළත් කළ යුතු බව දක්වා ඇති නමුදු, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ACA – C මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ රු. 9,372,330 ක ශුද්ධ ක්‍රියාකාරකම් වටිනාකම නැවත ගැලපීමක් සිදු නොකර මුදල් වල ශුද්ධ වෙනස්වීමක් ලෙස දක්වා තිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසි	නිරීක්ෂණය
(අ) හානි හා පාඩු ලේඛනය	මුදල් රෙගුලාසි 110 හා 104	යාවත් කාලීන කර නොතිබුණි.
(ආ) බැරකම් හා බැඳීම් ලේඛනය	මුදල් රෙගුලාසි 94	බැරකම් හා බැඳීම්වලට එළඹීම පිළිබඳ බැරකම් ලේඛනය යාවත් කාලීන කර නොතිබුණි.

(ඇ) ඇප ලේඛනය — මුදල් රෙගුලාසි 880 — අමාත්‍යාංශයේ නිලධාරීන් 29 දෙනෙකු ඇප තබා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය සඳහා වෙන්කර තිබූ රු. 11,458,600,000 ක් වූ මූලධන ප්‍රතිපාදනයෙන් රු. 6,694,694,598 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර රාජ්‍ය වියදම් සමාලෝචනය යටතේ වූ අමාත්‍ය මණ්ඩල උපදෙස් ප්‍රකාරව රු. 451,956,397 ක ඉතිරිය හැරුනු විට ප්‍රයෝජනයට නොගත් ප්‍රමාණය රු. 4,311,949,005 ක් හෙවත් සියයට 37 ක් විය.

(ආ) 2020 අංක 07 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය අනුව හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 ඡේදය අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කර දී ඇති පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමාවන් තුලම රැදී සිටීමින් වාර්ෂික වියදම් කලමනාකරණය කර ගැනීම සිදු කල යුතු බව දක්වා තිබුණද, පරිපූරක ඇස්තමේන්තු මත රු. මිලියන 5,755 ක් වැය විෂයයන් 2 කට ලබා ගෙන තිබූ අතර දෙසැම්බර් 31 දින වන විට ඉන් සියයට 23.2 ක් හෙවත් රු. 1,337,328,743 ක් ඉතිරි වී තිබුණි.

(ඇ) 2020 අංක 7 දරණ විසර්ජන පනතේ 5(1) හා 5 (2) වගන්ති සමඟ සාපේක්ෂව කියවිය යුතු මුදල් රෙගුලාසි 66 සහ 69 ප්‍රකාරව විරමොන් පරිපාටිය අනුගමනය කර ප්‍රතිපාදන ලබා ගෙන තිබුණද, වැය විෂය 2 කට අදාලව සියයට 37 ක් වර්ෂය අවසාන වන විට උපයෝජනය කර නොතිබුණි.

(ඈ) 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 3.4 ඡේදයට පටහැනිව වැය විෂයය 24 ක ඉතිරිය සියයට 6 සිට සියයට 100 දක්වා පැවතුණි.

(ඉ) මුදල් රෙගුලාසි 138 (1) ප්‍රකාරව වවුචරය සහතික කළ නිලධාරියා විසින් අදාළ වියදම් ශීර්ෂය, වැඩසටහන , ව්‍යාපෘතිය ආදියට අදාළ ගිණුමට නිවැරදි වැය බරක් බව සනාථ කළ යුතු වුවද වියදම් ව්‍යාපෘතිය අනුව වර්ගකිරීමේදී ව්‍යාපෘති 02 කට සටහන් කර තිබූ අවස්ථා මෙන්ම වියදම්, වැඩසටහන් අතර සටහන් කිරීමේදී වර්ගීකරණ දෝෂ තිබූ අවස්ථා 79 ක් ද නිරීක්ෂණය විය.

2.2 අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ හැකියා, ශක්තිය අපේක්ෂිත මෙහෙයුම්වල පරිමාණය සහ අදාළ කටයුත්තේ වියදම් සඳහා රජයට ප්‍රතිපාදනය කළහැකි අරමුදල් ප්‍රමාණය යන කරුණු සැලකිල්ලට ගෙන අත්තිකාරම් ගිණුමේ නියමිත සීමාවන් පැනවීමට කටයුතු කර

නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වියදමේ උපරිම සීමාව හා හර ශේෂයේ උපරිම සීමාව තත්‍ය අගය පිළිවෙලින් සියයට 19 ක් සහ සියයට 42 ක් විය.

(ආ) සේවය හැර ගොස් වර්ෂ 2 ක් ඉක්මවා ඇතත් නිරවුල් නොවූ ණය ශේෂය රු. 202,508 ක් විය.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 9 ක ඉතිරි කිරීම් එකතුව රු. 380,743 ක් ඉක්මවා රු. 1,551,496 ක බැරකම් ඇති කරගෙන තිබුණි.

(ආ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් බැදීම් හා බැරකම් පිළිබඳ තොරතුරු පද්ධතියට UPLOARD කර තිබූ බැරකම් ශේෂය රු. 1.391,475,563 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයේ වැඩසටහන් අනුව එම වටිනාකම රු.2,086,571,257 ක් විය.

2.4 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි **(i)** මු.රෙ. 371 (2) ආ	අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය නිම කල විගසම අග්‍රිමය පියවිය යුතු වුවත් අවස්ථා 45 කට අදාලව එකතුව රු. 697,038 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 1647 (අ) හා 1994 අගෝස්තු 3 දිනැති අංක 26/92 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	අමාත්‍යාංශය සතු වාහන 43 ක් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ) 2016 දෙසැම්බර් 26 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහන දෙක සඳහා පැවැත්විය යුතු දෛනික ධාවන සටහන් හෝ මාසික ධාවන වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.
(ඇ) 2019 ජනවාරි 12 දිනැති අංක DMA 01/2019 කළමනාකරණ විගණන චක්‍රලේඛය	වැටුප් ගෙවීම සම්බන්ධ උපදෙස් පත්‍රිකාවේ වැටුප් සකස්කිරීම් පරිගණක මෘදුකාංගයට අදාළ පලමු, දෙවන හා තෙවන මුරපද (Pass Ward) නිලධාරීන් අතර බෙදා දිය යුතු බව දැක්වුවද එසේ සිදුකර නොතිබුණි.

(ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

ආයතන අතර වත්කම් මාරු කිරීම හා පැවරීම සම්බන්ධයෙන් වත්කම්වල පොත් වටිනාකම ඇතුලත් ලේඛනයක් සැකසීම ,එය මාරු කිරීම පැවරීම් ආයතන වෙත ලබාදීම , වත්කම් තක්සේරු කිරීම ,ගැලපීම යනාදී කටයුතු සිදුකල යුතු වුවත් අමාත්‍යාංශය විසින් වත්කම් පැවරීම සිදුකිරීමේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.5 තැන්පතු ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් 2 ක එකතුව රු. 1,814,858 ක් වූ අතර එම ශේෂය තුළ වසර 1 ත් වසර 5 ත් අතර කාලයක් පැරණි රු. 1,059,123 ක තැන්පතු ශේෂයක් විය. 2022 අප්‍රේල් මාසය වනවිට ඉන් රු.240,000 ක් නිරවුල් කර තිබුණි.

(ආ) 2019 සහ 2020 වර්ෂයන් වලදී පුහුණු මධ්‍යස්ථානවලින් රැස්කළ රු. 526,472 ක ආදායම සහ නේවාසික පහසුකම් සැපයීම වෙනුවෙන් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රැස්කල රු. 157,032 ක් රජයේ ආදායමට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) පුහුණු වැඩසටහන් සඳහා ආසියානු පදනමෙන් ලද රු. 211,000 ක් එම පුහුණු වැඩසටහන් සඳහා යොදවා ගැනීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබූ අතර ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කිසියම් විශේෂ අත්සන් ලබාදීමේදී ඒ යටතේ ගෙවිය හැකි උපරිම ප්‍රමාණය පිළිබඳ බැංකුවට උපදෙස් ලබා දී නොතිබුණි.

(ආ) 2015 ඔක්තෝබර් 15 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 02 ඡේදය සඳහන් TOD/BA/01 ආකෘතියේ 11 යටතේ සඳහන් කර ඇති පරිදි මු.රෙ. 880 ප්‍රකාරව අමාත්‍යාංශයේ නිලධාරීන් 29 දෙනෙකු ඇප තබා නොතිබුණි.

(ඇ) නරක් වූ හෝ අවලංගු කරන ලද චෙක්පත් පිළිබඳ වාර්තා තබාගැනීමක් සිදුකර තිබූ නමුත් එම වාර්තා අභ්‍යන්තර විගණන අංශය වෙත යොමුකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අමාත්‍යාංශ මෙහෙවර

(අ) 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය අමාත්‍යාංශය විසින් සිදුකල යුතු කාර්යයන් හා කර්තවයන්ද සුවිශේෂී ප්‍රමුඛතා 5 ක් ද හඳුන්වා දී තිබුණි. එම සුවිශේෂී ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාපිත ආයතන 3 ක් වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධිකාරිය සහ රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව යන ආයතනවල පාලන බලය අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. එහෙත් රාජ්‍ය අමාත්‍යාංශය විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය ප්‍රාග්ධන සමාගම හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධිකාරිය යන ආයතන දෙකට අදාළ මෙහෙයුම් කටයුතු පිළිබඳව තොරතුරු සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් විමසා තිබුණද එම ආයතන පිළිබඳ තොරතුරු ලබාගත නොහැකි වී තිබුණි.

(ආ) රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථා සමාගම සතුව 2021 ජූලි 15 දිනට රු. 1,521,370 ක බැංකු වාසි සහගත ශේෂයක් ද, රු. 61,928,356 ක ස්ථාවර තැන්පතුවක් ඇති අතර සි/ස රබර් අපනයන සංස්ථාවට හිමිකාරත්වය ඇතිව කළමනාකාරිත්වය පමණක් මෙම සංස්ථාවට පැවරී ඇති වත්කම් 3 ක් බදු දීමෙන් වසරකට රු. 10,849,164 ක බදු ආදායමක් සංස්ථාව විසින් 2021 ජූලි 15 දිනට උපයා තිබුණද මෙම සංස්ථාව පාලක මණ්ඩලයක් සහිතව ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින බව අමාත්‍යාංශයේ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. එමෙන්ම සංස්ථාව සතුව පවතින ඇල්පිටිය කර්මාන්තශාලාව වසර 20 ක් පුරා වසා දමා ඇති බවත් මෙම සංස්ථාවට අයත් වත්කම් වගකීම් පිළිබඳ වාර්තා නීතිමය වශයෙන් තහවුරු කර ගැනීමට ලිඛිත ලියවිලි අමාත්‍යාංශය සතු නොවන බවත් තවදුරටත් මුදල් අමාත්‍යාංශය වෙත අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා තිබුණි.

3.2 කාර්ය සාධනය

3.2.1 සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය

අන්ත දිළින්දන් ක්‍රමිකව ඉසුර කරා රැගෙන යාමේ අරමුණින් තෝරාගත් දිස්ත්‍රික්ක 3 ක ප්‍රතිලාභීන් 165 ක් ඉලක්ක කරගෙන රු. මිලියන 16.08 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිලාභීන් 108 ක් වෙනුවෙන් රු. මිලියන 10.52 ක ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. මෙම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික්ක තුන තෝරාගැනීම සසම්භාවීව සිදුකර තිබූ අතර, ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා පදනම් වූ කරුණු හා තෝරා ගැනීම ක්‍රමවේදය සහ නියමු ව්‍යාපෘතියේ ඵලදායිත්වය ඇගයීමේ ක්‍රමවේදය පිළිබඳව විගණනයට ප්‍රමාණවත් තොරතුරු අනාවරණය නොවුණි.

3.2.2 වෙනත් රේඛීය අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන හරහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා ලබාදුන් රු. 672,100,000 ක ප්‍රතිපාදන

සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 773.9 ක් විවිධ ආයතන වෙත ප්‍රතිපාදන ලෙස වෙන්කර ව්‍යාපෘති 22,215 ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණද 2021 වර්ෂයේ 4 වන කාර්තුවේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවට අනුව ව්‍යාපෘති 13,020 ක් නිමකිරීමට රු. මිලියන 686.66 ක් වැයකර තිබුණි. නිම කරනලද ව්‍යාපෘති වලට අදාලව අක්මුදල් ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් මිලදීගත් භාණ්ඩ හා උපකරණ සහ වෙනත් වියදම් වෙනුවෙන් අතැති බිල්පත් වටිනාකම රු. 75,625,000 ක් විය.

3.2.3 සෞභාග්‍යා ජාතික ගම්මාන සවිබල ගැන්වීමේ වැඩසටහන

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සෞභාග්‍යා සමෘද්ධි නිෂ්පාදන ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. මිලියන 1,800 ක් වැයකර ව්‍යාපෘති 1,250 ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්කගත කර තිබුණි. දෙසැම්බර් 31 දිනට වූ ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘති 1,591 ආරම්භකර ඇති බවත් ඉන් ව්‍යාපෘති 1,436 ක් වෙනුවෙන් රු. මිලියන 733.92 ක් වැයකර ඇති බවත් රු. මිලියන 819.22 ක අතැති බිල් ඇති බවත් දක්වා තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අක්මුදල් ඉල්ලුම් කිරීම වර්ෂය අවසානයේ සිදුකර තිබීම හේතුවෙන් ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණු අතර ප්‍රතිපාදන මුදලින් රු. මිලියන 246.86 ක් ඉතිරි වී තිබුණි.

(ආ) නිෂ්පාදන ක්ෂේත්‍ර හඳුනාගැනීම හා ගම්මාන තෝරා ගැනීමේදී එක් එක් ගම්මානයන්හි පවතින සම්පත් සුලභතාව, නිෂ්පාදන විෂමතාව හා තිරසරව ක්‍රියාත්මක කිරීමේ හැකියාව හෝ පවතින නිෂ්පාදනයක් මූලික කරගනිමින් හෝ ගම්මාන තෝරාගැනීම කලයුතු බවත් නිෂ්පාදන අඛණ්ඩව කරගෙනයාම සඳහා අමුද්‍රව්‍ය බහුලව පැවතීම, භූගෝලීය/ දේශගුණික ප්‍රදේශ අනුව වඩා යෝග්‍යතම නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීමට පවතින විභවතාවයක් තිබීම යනාදී අවධානය යොමුකල යුතු විශේෂිත කරුණු කෙරේ අවධානය යොමු නොකොට ගම්මාන තෝරා ගැනීම සිදුකර ඇති බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. උදා : හෝමාගම - පොල් ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන

(ඇ) කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව චක්‍රලේඛ ප්‍රකාරව තනි පුද්ගලයෙකු සඳහා රුපියල් ලක්ෂයක් පමණක් ලබාදිය යුතු වුවද එක් යන්ත්‍රයක වටිනාකම රු. 605,000 ක් වන පොල්තෙල් නිෂ්පාදන යන්ත්‍ර 8 ක් ප්‍රතිලාභීන් 8 දෙනෙකු වෙනුවෙන් ද ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙනුවෙන් පොල්ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රයක් ලබාදිය යුතු වුවද රු. 175,000 ක් වටිනා පොල්ලෙලි ක්පන යන්ත්‍රයක් එක් ප්‍රතිලාභියෙකුටත් ලබා දී තිබුණි. එහෙත් අවශ්‍ය අමුද්‍රව්‍ය නොමැතිවීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක පවතින බව 2021 දෙසැම්බර් 14 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

3.2.4. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ආශ්‍රිත - පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී 2021 වර්ෂය තුළ වැඩ අවසන් කිරීමට හැකි යෝජනා පමණක් තෝරාගත යුතු බවත් ඉදිරි වර්ෂය සඳහා අවිච්ඡේද නොකරන බව දන්වා තිබියදී නියැදි පරීක්ෂණයට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක ව්‍යාපෘති 5 කට අදාලව එකතුව රු. 8,995,587 ක අතැති බිල්පත් විය.

(ආ) තිඹිරිගස්යාය, කිරුළපන කොළකැඳ/ හෙල ඔසු නිෂ්පාදනය යන සෞභාග්‍යා නිෂ්පාදන ව්‍යාපෘතියෙහි ප්‍රමුඛතම අවශ්‍යතාවය ලෙස නව නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමට හඳුනාගෙන තිබුණද එම අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමුනොකර සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදිත රු. 3,000,000 ක මුදලින් රු. 1,488,402 ක් වැය කර පවතින නිෂ්පාදනාගාරය ආසන්නයේ පවතින අබලන් වූ මාර්ගය අළුත්වැඩියා කර රු. 1,511,598 ක්වූ ඉතිරි මුදල් අමාත්‍යාංශය විසින් ආපසු ලබාගෙන තිබුණි. ඒ අනුව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවල ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනයට සෘජුව දායකවන පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණ ඉටුවී නොමැතිබව නිරීක්ෂණය විය.

(ඇ) 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොන්ත්‍රාත් පැවරීම නිර්දේශ කිරීමේදී අදාළ කොන්ත්‍රාත්කරුට මූල්‍ය පහසුකම් ඇති බවට බැංකු ප්‍රකාශන මඟින් සනාථ කර ගැනීම, කොන්ත්‍රාත්කරුගේ පලපුරුදුකම් වැඩ පිළිබඳ ප්‍රමිතය පිළිබඳව සෑහීමකට පත්විය හැකි සාක්ෂි පැවතීම, අවුරුද්දකට පෙර පිරිනමා ඇති නමුත් අසම්පූර්ණ කර ඇති කොන්ත්‍රාත් පිළිබඳව සහ අදාළ කාර්ය උප කොන්ත්‍රාත් නොදෙන බවට සමිතිය විසින් නිකුත් කල ප්‍රකාශ පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් සැහීමකට පත්වන්නේ නම් කොන්ත්‍රාත් පිරිනැමිය හැකි බව දන්වා තිබුණද, හෝමාගම, පාදුක්ක සහ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ව්‍යාපෘති සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවුණි.

(ඈ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ආශ්‍රිත ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනයට සෘජුවම දායකත්වයක් ලබාදෙන යටිතල පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වුවත් එයට පටහැනිව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවලින් බැහැර ප්‍රදේශවල මාර්ග ඉදිකිරීම සහ පැති බැමි හා කාණු පද්ධතිය සැකසීම, විශේෂ ව්‍යාපෘති වශයෙන් නම්කර සමාලෝචිත වර්ෂයේ දී ව්‍යාපෘති 4 ක් සඳහා රු. 5,306,972 ක් වැය කර තිබුණි.

3.2.5 ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමෘද්ධි නිෂ්පාදන ගම්මාන හා සෞභාග්‍යා නිෂ්පාදන පොකුරු ගම්මාන වැඩසටහන යටතේ තෝරාගත් ආදර්ශ ගම්මාන 50 ක් තුල ප්‍රජාවගේ ජීවන තත්ත්වයේ සිදු වී ඇති වෙනස්කම් පිළිබඳ පර්යේෂණයක් සිදුකිරීම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්ව තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ආදර්ශ ගම්මාන 25 ක් පිළිබඳව පමණක් පර්යේෂණයට භාජනය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකාව තුළ ග්‍රාම සංවර්ධන හා දිලිඳුකම පිටු දැකීමේ අරමුණින් ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට හා අයවැය ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය සඳහා වෙන් වී ඇති රු. මිලියන 50.36 ක මුදලින් ආයතනයේ අරමුණු ඉටුකරගැනීම වෙනුවෙන් වූ ක්‍රියාකාරකම් 8 ක් වෙනුවෙන් ප්‍රතිපාදන මුදලින් සියයට 1.6 ක් හෙවත් රු. මිලියන 0.83 ක් පමණක් වෙන්කර තිබුණි. ඉතිරි සියයට 82.6 ක ප්‍රතිපාදිත මුදලින් සියයට 10.6 ක් ගොඩනැඟිලි අළුත්වැඩියා හා කාර්යාල උපකරණ මිලදී ගැනීමටත් සියයට 72 ක් පුනරාවර්තන වියදම් සඳහාත් වැයකර තිබුණි. බාහිර ආයතන වලට සේවා සැපයීමෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 538,378 ක ආදායමක් ලබාගෙන තිබුණු අතර මෙම ආයතනය පිහිටුවීමේ අරමුණු හා කාර්යභාරයක් වෙනුවෙන් සෘජුව වැය කරන ලද මුදල සියයට 1.6 ක් පමණක් විය.

3.2.6 කාර්ය සාධන වර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර ඇති කෙටුම්පත් කාර්යසාධන වාර්තාව අනුව ගෘහ කළමනාකරණය හා කුටුම්භ සංවර්ධන ක්‍රියාවලිය තුළින් ව්‍යවසායකත්ව පුහුණුව ලබාදීම හා ඒ තුළින් අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම මාර්ගගත වැඩසටහන් 04 ක් පවත්වා 179 දෙනෙකු සහභාගි වී තිබුණු බවත් 2021 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව එය පවුල් 200 ක් සවිබල ගන්වා මාර්ග ගත වැඩසටහන් 19 ක් පවත්වා නිලධාරීන් 850 ක් සහභාගි වී තිබූ බව දක්වා තිබුණි.

(ආ) සමෘද්ධිලාභී පවුල් ලක්ෂ දෙකේ ව්‍යාපෘතිය සඳහා සමෘද්ධි දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කල ප්‍රගති වාර්තා අනුව තෝරාගත් ව්‍යාපෘති 192,958 ක් වෙනුවෙන් රු. මිලියන 4,600.9 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාව අනුව ව්‍යාපෘති 75,768 ක් සහ රජයේ දායකත්වය රු. මිලියන 2,649.37 ක් බවත් දක්වා තිබුණි. අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාවට අනුව ව්‍යාපෘති 64,392 ක් හා රු. මිලියන 2,415.39 ක වියදමක් දරා ඇති බව දක්වා තිබුණි.

3.3 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අමතරව ශීර්ෂ 240 යටතේ පරිපූරක ඇස්තමේන්තු මඟින් සමෘද්ධිලාභී පවුල් ලක්ෂ දෙකක් සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 5,750 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. ඉන් රු. 4,691,980,006 ක්

සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කර තිබූ අතර නිදහස් කරන ලද මුළු ප්‍රතිපාදනවලින් රු. 102,071,740 ක් ආපසු පවරාගෙන තිබුණි. වැයකරන ලද මුදලින් රු. 433,337,832 ක් 2021/22 ගෙවතු වගා වියදම් සඳහා වැයකර තිබුණි.

(ආ) සමෘද්ධිලාභී පවුල් ලක්ෂ දෙකේ ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් රු. මිලියන 33.5 ක ප්‍රතිපාදනවලින් වැඩසටහන යටතට නොගැනෙන ප්‍රධාන කාර්යාලයේ අවශ්‍යතාවය සඳහා තේක්ක අල්මාරි 02 ක් මිලදී ගැනීම සහ කාර්යාල මේස රෙදි මිලදී ගැනීම වෙනුවෙන් රු. 227,788 ක්ද සමෘද්ධි රන්පත් සහතිකපත් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු. 7,143,750 ක්ද දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි. සමෘද්ධි රන්පත් සහතික ප්‍රදානය කිරීම පිළිබඳ විධිමත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

3.4 **වත්කම් කළමනාකරණය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2020 වන විට ප්‍රජාපාලිත හා නිෂ්පාදන සේවා අභිමුඛ ග්‍රාම නිලධාරී වසම් 5,000 ක් ඇති කිරීම තුළින් එම ග්‍රාම තුළ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ජනතාවගේ මාසික ආදායම දෙගුණකිරීම අරමුණින් ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා 2017, 2018 හා 2019 වර්ෂවල ප්‍රතිපාදන ලබාදී තිබුණි. 2020 ජුනි 30 දින වන විට ලබා දී ඇති ප්‍රතිපාදන එකතුව රු. මිලියන 2,391.90 ක් විය. 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් එවන ලද වාර්තා අනුව දිස්ත්‍රික්ක 12 ක පිහිටුවා ඇති ග්‍රාමශක්ති සමිති සංඛ්‍යාව 1975 ක් වූ අතර එදිනට පවතින මුදල් ශේෂය රු. 791,789,538 ක් සහ ග්‍රාමශක්ති කාර්යාංශයට අදාලව අය වියයුතු ක්ෂුද්‍ර මූල්‍ය ණය ශේෂය රු. 200,394,099 ක්ද විය. එම සමිතිවලින් වර්තමානය වනවිට සමිති 999 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(ආ) ග්‍රාම ශක්ති කාර්යාංශය සතුව විවිධ අයිතම වර්ග 49 කට අදාල කාර්යාල උපකරණ ඒකක 519 ක් පැවති අතර එම කාර්යාල උපකරණවලින් අයිතම 14 කට අදාල භාණ්ඩ ඒකක 38 ක් පමණක් සෞභාග්‍යා කාර්යාංශය වෙත පවරාගැනීමට කටයුතු කර තිබුණි. ඉතිරි වත්කම් පවරා ගැනීමට කටයුතු නොකර 2021 වර්ෂයේ සෞභාග්‍යා කාර්යාංශය වෙනුවෙන් කාර්යාල උපකරණ මිළදී ගැනීම සඳහා රු. 5,717,938 ක් වැය කර තිබුණි.

(ඇ) අමාත්‍යාංශයන්ට අයත්වන ආයතන වෙනස්වීම්වලට පෙර වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති ග්‍රාම ශක්ති කාර්යාලයේ කටයුතු මෙම අමාත්‍යාංශයට අයත් සෞභාග්‍යා කාර්යාංශයට අනුයුක්ත කර තිබුණද ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ග්‍රාම ශක්ති කාර්යාලයට ලබාදී තිබූ ඩබල් කැබරථය හා වෑන් රථය සෞභාග්‍යා කාර්යංශය වෙත ලබා දී නොතිබුණි.

3.5 හානි හා පාඩු පිළිබඳ පරීක්ෂාව

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 සැප්තැම්බර් 24 දින අනතුරට පත් වූ වාහනය සම්බන්ධයෙන් මු.රෙ. 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව අනතුර සිදුවී වසර 2 කට පසු ඉදිරිපත් කර ඇති අතර 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තාවන් ඉදිරිපත් කිරීම හා මු.රෙ. 105,106 ප්‍රකාරව ක්‍රියාකිරීම අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දක්වා වසර 7 කට වැඩි කාලයක් ගත වී තිබුණද අනතුරට පත් මෙම වාහනය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණු අතර අනතුර සම්බන්ධව රක්ෂණ වන්දි ඉල්ලුම් කිරීම වසර 6 කට පසුව 2020 ඔක්තෝබර් 26 දින දී අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශයෙහි මෙම අනතුර සම්බන්ධ කරුණු වාර්තා කර නොතිබුණි.

(ආ) රාජ්‍ය අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයාට අනුයුක්ත කරන ලද නිල රථය 2021 අප්‍රේල් 17 දින අනුරාධපුර දහයියාගමදී අනතුරකට පත්ව තිබුණු අතර කැබරථයේ නියෝජිත ආයතනය විසින් අළුත්වැඩියා වියදම රු. 371,945 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ අතර රක්ෂණ වන්දි වශයෙන් රු. 263,508 ක් ලැබී තිබුණි. අළුත්වැඩියා වියදමෙහි ඉතිරිය වන රු. 108,411 ක් අමාත්‍යාංශය විසින් නියෝජිත ආයතනය වෙත ගෙවා තිබූ අතර අනතුරට අදාල මු.රෙ. 104 (3) ප්‍රකාරව විමර්ශනයක් අනතුර සිදුවී මාස 6 කට පසු එනම් 2021 සැප්තැම්බර් 29 දින සිදුකර තිබුණි.

(ඇ) වාහන 2 ක් අවස්ථා 3 කදී අනතුරුට පත් වීම සම්බන්ධයෙන් මු.රෙ. 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2021 මාර්තු 10 දින අනතුරට පත් වීමෙන් ජීප්රථයකට සිදුවූ රු. 18,400 ක් වූ හානිය පිළිබඳව මු.රෙ. 110 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොතිබුණි.

(ඉ) 2020 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් අනාවරණය වූ රු. 138,000 ක්වූ රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ Dialog I phone 64 GB (90) 01 දුරකතනයේ ඌනතාවය හානි හා පාඩු පිළිබඳ ලේඛනයේ ඇතුළත් කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ අමාත්‍යාංශය සඳහා පෞද්ගලික මූල්‍ය සමාගමකින් 2017 සහ 2018 වර්ෂ වලදි අවුරුදු 5 ක කාලයක් සඳහා වාහන දෙකක් ලබාගෙන තිබුණි. මෙම වාහන දෙක සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට රු. 13,542,304 ක මුදලක් ගෙවා තිබූ අතර මාසිකව අවම වශයෙන් ධාවනය කල යුතු කි.මී.3,000 දුර ප්‍රමාණයවත් ධාවනය කර නොතිබුණි. පිරිවැය වාර්තා අනුව අමාත්‍යාංශයේ සංචිත වාහන ධාවනය ඉතා අවම මට්ටමක පැවතියදී හා සංචිත වාහන ඵලදායීව උපයෝජනය කර නොතිබියදී සහ අමාත්‍යාංශය සතු වාහන වෙනත් ආයතනවලට පවරා දී තිබියදී කල්බදු පදනම මත වාහන ලබාගෙන 2021 දෙසැම්බර් 31 දින වන විට කල්බදු වාරික වශයෙන් රු. 13,542,304 ක් ගෙවා තිබුණි.

3.7 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) සහ 4.2.2 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව සහ ප්‍රසම්පාදන කාල සටහන ඇතුළත් වන පරිදි පිළියෙල කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට හා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ රු. 11,037,137 ක් වටිනා කාර්යාල හා පරිගණක උපාංග සහ ඇඳන් හා පුටු මිලදී ගෙන තිබුණි.

(ආ) රජයේ අනුමත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව අවස්ථා 10 කදී එකතුව රු. 11,037,137 ක් වටිනා කාර්යාල උපකරණ , පරිගණක හා පරිගණක උපකරණ 2021 ජූලි 05 දිනැති අංක අමප/21/1118/313/036 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් මිලදී ගෙන තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධ තොරතුරු පහත දැක් වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු /අතිරික්ත
ජ්‍යෙෂ්ඨ මට්ටම	25	26	+01
තෘතීය මට්ටම	01	04	+03
ද්විතීය මට්ටම	16	283	+267
ප්‍රාථමික මට්ටම	18	55	+37
	60	368	308

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තෘතීය මට්ටම අනුමත සංඛ්‍යාව 01 වුවද කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගනු ලැබූ පරිපාලන නිලධාරි තනතුරද ඇතුළත්ව තනතුරු 3ක් අතිරික්තව පැවතුණි.

(ආ) ද්විතීය මට්ටමේ හා ප්‍රථමික මට්ටමේ තනතුරු පිළිවෙලින් 16 හා 18 ක් අනුමත වුවද තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 283 ක් හා 55 ක් වශයෙන් අනුමත ප්‍රමාණය ඉක්මවා 304 ක් සේවයේ යොදවා තිබුණි.

(ඇ) 2020 සැප්තැම්බර් 04 දිනැති අංක DMS/SM/02 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ 05 ඡේදය අනුව මෙම අමාත්‍යාංශය ජනතා කේන්ද්‍රීය රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සඳහන් කාර්යයන්, කර්තව්‍යයන්, ප්‍රමුඛතාවයන් සහ ඊට අදාල ඉලක්ක ලගා කර

ගැනීමේදී අදාල ක්ෂේත්‍රයන්හි විශේෂ දැනුම් හා නිපුණතාවන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩල දායකත්වයක් අවශ්‍ය වන බවත්, එම කරුණු සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම් කල යුතු බවත් ඒ සඳහා විධිමත් පරිදි යෝජනා ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා දැනට සිටින තත්‍ය කාර්යමණ්ඩලය අනුමත කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් 2021 ජනවාරි 19, 2021 පෙබරවාරි 11 සහ 2021 අගෝස්තු 02 දිනැති අංක SMS/ADM/1/2/1-2019 දරන ලිපි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණද 2022 වර්ෂය වන තෙක්ම ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

(ඉ) 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය අනුව අමාත්‍යවරයාගේ සහය කාර්යමණ්ඩල සංයුතිය හා ප්‍රමාණය දක්වා තිබූ අතර එම සංයුතියෙහි ඇතුළත් නොවන විධියෝ කැමරා ශිල්පි, වෘත්තීය සමිති සම්බන්ධීකරණ සහ කැමරා ක්‍රියාකරු සහයක යන තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගෙන ඔවුන් අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර වැටුප් ලබා දී තිබුණි.

කේ. සී. පී. සේනාරත්න

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
පාලන අංශය			
කුසලතා හා දැනුම වර්ධන සහ ආකල්ප හා දැනුම වර්ධන පූහුණු වැඩසටහන් යටතේ පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව	√		
උපදේශන අංශය			
ප්‍රමිතිගත උපදේශන සේවාව සැපයීම සඳහා සකස් කරන ලද නෛතික රාමුව			√
විධිමත් ක්‍රමවේදයක් සහිතව ප්‍රතිනිර්මාණය කරන ලද 24 පැය ජංගම දුරකථන උපදේශන සේවාව මඟින් උපදේශනය ලබාගත් සේවාලාභීන් සංඛ්‍යාව	√		
උපදේශන සේවාව ප්‍රවර්ධනය සඳහා යොදාගන්නා ලද ප්‍රචාරණ මෙවලම් සංඛ්‍යාව	√		
ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සම්බන්ධීකරණය හා අධීක්ෂණය කරන ලද උපදේශන ක්‍රියාකාරම් සංඛ්‍යාව	√		
ප්‍රජාව මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරු වීම වැළැක්වීම සඳහා පවත්වන ලද කණ්ඩායම් උපදේශන වැඩසටහන් සංඛ්‍යාව	√		
ඉදි කරන ලද, ඉඩකඩ වෙන් කරගැනීම් කරන ලද, නඩත්තු කටයුතු කරන ලද හා කාර්යාල උපකරණ ලබා දෙන ලද සිත්සරණ උපදේශන මධ්‍යස්ථාන සංඛ්‍යාව	√		
උපදේශන නිලධාරීන්ගේ නිපුණතාවන් සංවර්ධනය	√		
ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය			
ආධාරක උපකරණ ලබාදුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව	√		
වෛද්‍ය ආධාර ලබා දුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව	√		
අධ්‍යාපන ආධාර ලබා දුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව	√		
ස්වයංරැකියා ආධාර ලබාදුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව	√		
නිවාස ආධාර ලබාදුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව			√ (55% සුපිරි වාසනා ලොතරැයි ආදායම් අඩු වීමහේතුවෙන් අපේක්ෂිත ප්‍රතිපාදන නොලැබීම)
රු.5000 මාසික ජීවනාධාර ලබා දුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව	√		
සංවර්ධනය වූ තනිමාපිය පවුල් සංඛ්‍යාව	√		
රු.5000/- ජීවනාධාර ලබා දුන් වකුගඩු රෝගීන් සංඛ්‍යාව	√		
නඩත්තු වියදම් ගෙවීම මඟින් සුබසාධනය ලැබූ වික්ටෝරියා නිවාසයේ නේවාසික පිරිස	√		
රැකියා පුහුණුව ලැබූ ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව	√		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
හැකියා වර්ධනය කරගත් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව	√		
ජාතික සමාජ සංවර්ධන ආයතනය			
සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව හදාරන ලද සිසුන් සංඛ්‍යාව	√		
සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී පාඨමාලාව හදාරන ලද සිසුන් සංඛ්‍යාව	√		
සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ලද සිසුන් සංඛ්‍යාව	√		
ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ පුද්ගලයින් සංඛ්‍යාව	√		
වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සහභාගී වූ පුද්ගලයින් සංඛ්‍යාව	√		
උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා හදාරන ලද සිසුන් සංඛ්‍යාව	√		
ඉදිකරන ලද නව ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ගොඩනැගිල්ල		√	
මුද්‍රණය කර ඇති සමාජ වැඩ පිළිබඳ ප්‍රකාශන සංඛ්‍යාව	√		
විවිධ සමාජ ගැටළු සම්බන්ධයෙන් සිදුකර ඇති පර්යේෂණ හා ශක්‍යතා අධ්‍යයන සංඛ්‍යාව		√	
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය			
විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බදවා ගන්නා ලද සාමාජිකයින් සංඛ්‍යාව			√
විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ විශ්‍රම වැටුප් ලැබූ සාමාජිකයින් සංඛ්‍යාව	√		
ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය			
නිම කරන ලද පර්යේෂණ/ සමීක්ෂණ සංඛ්‍යාව (දිලිඳුකම තුරන්කිරීමේ වැඩසටහන් පිළිබඳ පර්යේෂණ/ සමීක්ෂණ)	√		
වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන සංඛ්‍යාව		√	
සහභාගිවූ සංඛ්‍යාව සහ හඳුනාගත් වැඩසටහන් සංඛ්‍යාව(2021 වාර්ෂික සැලැස්ම පිළිබඳ සමාලෝචනය සහ 2022 වාර්ෂික සැලැස්ම සැකසීම)		√	
පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සහ සහභාගි වූ පුහුණුලාභීන් සංඛ්‍යාව (අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීමේ කටයුතුවල නිරත සංවර්ධන මැදිහත්කරුවන් සඳහා වූ පවත්වන ලද පුහුණු වැඩසටහන)	√		
නිකුත් කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව (ප්‍රජාශක්ති සහරාව, වෙබ් ප්‍රකාශනය)	√		
යාවත්කාලීන කරන ලද ලිපි සංඛ්‍යාව (වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම)	√		
නිකුත් කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව (තරණය පුවත් හඝුන, වෙබ් පිටුව)	√		
මිලදී ගත් උපකරණ සංඛ්‍යාව (කාර්යාල උපකරණ මිලදී ගැනීම)	√		
ව්‍යාපෘති සංඛ්‍යාව (ගොඩනැගිලි අලුත්වැඩියාව)		√	
සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය			
ස්ථාපිත කරන ලද සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සංඛ්‍යාව	√		
සංවර්ධනය කරන ලද පොදු යටිතල පහසුකම් ව්‍යාපෘති සංඛ්‍යාව	√		
පවත්වන ලද සෞභාග්‍යා ප්‍රචර්ධන වැඩසටහන ප්‍රමාණය	√		
ගෙවා අවසන් කරන ලද ග්‍රාම ශක්ති අතැති බිල්පත් ප්‍රමාණය	√		

පරිච්ඡේදය 05 – තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0 % - 49 %	50 % - 74 %	75 % - 100 %
පාලන අංශය					
1. පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම	නිලධාරීන් විසින් සපයනු ලබන සේවාවේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම	පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව			√
උපදේශන අංශය					
1. නිරෝගි ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	ප්‍රජාව මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරු වීම වැළැක්වීම සඳහා උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම	සේවාව ලබා ගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව			√
2. තිරසාර සංවර්ධනයසඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතනයන් ගොඩනැගීම	ප්‍රමිතිගත උපදේශන සේවාව සැපයීම සඳහා නෛතික රාමුව සකස් කිරීම	සේවාව ලබා ගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව			√
ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය					
1.සෑම තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	ආබාධ සහිත තැනැත්තන් සඳහා රු.5000 මාසික ජීවනාධාර ලබා දීම	ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව			√
	තනිමාපිය පවුල් සංවර්ධන වැඩසටහන	තනිමාපිය පවුල් සංඛ්‍යාව			√
	ආබාධ සහිත තැනැත්තන් සඳහා ස්වයංරැකියා ආධාර ලබාදීම	ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව			√
	ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීම	ආබාධ සහිත තැනැත්තන්		√	

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0 % - 49 %	50 % - 74 %	75 % - 100 %
		සංඛ්‍යාව			
2. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	දීර්ඝ කාලීන ප්‍රතිකාර ලබන රෝගීන් සඳහා වෛද්‍ය ආධාර ලබා දීම	ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව			√
	වකුගඩු රෝගීන් සඳහා රු.5000/- ජීවනාධාර ලබා දීම	කාලික වකුගඩු රෝගීන් සංඛ්‍යාව			√
	ආබාධ සහිත තැනැත්තන් සඳහා ආධාරක උපකරණ ලබා දීම	ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව			√
	ඩික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාමට ආධාර ලබා දීම	නේවාසික ඇඳගත රෝගීන් සංඛ්‍යාව			√
3. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකියා පුහුණුව ලබාදීම	ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව			√
	ආබාධ සහිත තැනැත්තන් සඳහා ස්වයංරැකියා ආධාර ලබාදීම	ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව			√
	ආබාධ සහිත තැනැත්තන් සඳහා හැකියා වර්ධන වැඩසටහන	ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව			√
	ආබාධ සහිත තැනැත්තන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම	ආබාධ සහිත දරුවන්			√
	ආබාධ සහිත තැනැත්තන් සවිබලගැන්වීමේ වැඩසටහන	ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව			√
ජාතික සමාජ සංවර්ධන ආයතනය					
1. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	සමාජ වැඩ පිළිබඳ අධ්‍යාපනය ලබාදීම	පාඨමාලා හදාරන ලද සිසුන් සංඛ්‍යාව			√
	ක්ෂේත්‍ර අධීක්ෂකවරුන්ගේ හා ප්‍රජාමූලික සංවිධාන නායකයන්ගේ ධාරිතා සංවර්ධනය	සහභාගී වූ පුද්ගලයින් සංඛ්‍යාව			√
	වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ	සහභාගී වූ සිසුන් සංඛ්‍යාව			√

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0 % - 49 %	50 % - 74 %	75 % - 100 %
	අධ්‍යාපනය ලබාදීම				
	උපදේශනය පිළිබඳ අධ්‍යාපනය ලබාදීම	සහභාගී වූ සිසුන් සංඛ්‍යාව			√
	සමාජ වැඩ අධ්‍යාපනයට සුදුසු භෞතික පරිසරය සකස් කිරීම	ඉදිකරන ලද නව ගොඩනැගිල්ල		√	
	සමාජ වැඩ පිළිබඳ දැනුවත් භාවය වැඩිකිරීම (ප්‍රකාශන මඟින්)	මුද්‍රණය කර ඇති ප්‍රකාශන සංඛ්‍යාව	√		
2. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	විවිධ සමාජ ගැටළු සම්බන්ධයෙන් පර්යේෂණාත්මක අධ්‍යයනයන් සිදුකිරීම	සිදුකර ඇති පර්යේෂණ හා ශක්‍යතා අධ්‍යයන සංඛ්‍යාව		√	
ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය					
1. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	කාන්තා සහභාගීත්වය වැඩි කිරීම සඳහා අභිප්‍රේරණ වැඩසටහනක් පැවැත්වීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව		√	
	ග්‍රාමීය ප්‍රජාව සහ ප්‍රජා මූලික සංවිධාන (සීබීඕ) සාමාජිකයින් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව			√
1. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියෙහි නියැලී සිටින රජයේ නිලධාරීන් / රාජ්‍ය නොවන නිලධාරීන් සමාජ බලමුලු ගැන්වීමේ වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව			√
	ග්‍රාමීය ව්‍යවසායකයින් සඳහා පුහුණු හා නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව			√
2 .සියලු තැන්හි පවතින සෑම ආකාරයෙන්ම දුගී බව අවසන් කිරීම	දරිද්‍රතාවය පිටුදැකීම සහ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව			√

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0 % - 49 %	50 % - 74 %	75 % - 100 %
	රාජ්‍ය නොවන සංවිධාන සඳහා නේවාසිකාගාර, දේශන ශාලාව සහ ආපනශාලා පහසුකම් සැපයීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව			√
සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය					
1. සියලු තැන්හි පවතින සෑම ආකාරයෙන්ම දුගී බව අවසන් කිරීම	නිෂ්පාදන ගම්මාන පිහිටුවීම මගින් අඩු ආදායම්ලාභීන්ට තිරසාර ආදායම් මාර්ගයක් සකසා දීම	පිහිටුවන ලද නිෂ්පාදන ගම්මාන සංඛ්‍යාව			√
2. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම. පූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය ගොඩනැගීම	ජීවනෝපාය සංවර්ධනය සඳහා ඉවහල්වන යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	සංවර්ධනය කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘති සංඛ්‍යාව			√

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

පවත්නා කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ව්‍යාපෘති අපේක්ෂිත ඉහළම මට්ටමට ක්‍රියාත්මක කිරීමට බාධා ඇතිවීම

1. ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලය හා භෞතික සම්පත් නොතිබීම
2. නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ගම් මට්ටමේ නිලධාරීන්ගේ දැනුවත්භාවය අඩුවීම
3. සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී නූතන තාක්ෂණික ක්‍රම යොදා ගැනීමට නිලධාරීන් දක්වන ඍණාත්මක ආකල්ප හා ඒ සඳහා ප්‍රමාණවත් භෞතික සම්පත් නොතිබීම
4. ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රජාව සක්‍රිය ලෙස දායක කර ගැනීමට පවතින බාධා
5. සැලසුම් කර ගත් පරිදි අක් මුදල් නොලැබීම

පරිච්ඡේදය 06 – මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

ආයතනය	ජ්‍යෙෂ්ඨ මට්ටම		තෘතීය මට්ටම		ද්විතීය මට්ටම		ප්‍රාථමික මට්ටම		එකතුව		
	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	හිඟ/ඉපුබු සංඛ්‍යාව
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයංරැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	26	25	-	02	16	284	18	55	60	366	-306
ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය	01	01	07	07	26	18	06	1	40	25	15
ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය	04	03	13	13	17	15	11	07	45	38	07
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය	08	08	14	14	133	108	43	36	198	166	32
ජාතිකසමාජ සංවර්ධන ආයතනය	53	33	11	05	47	40	27	22	138	100	38
සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය	09	10	04	-	74	29	10	-	97	39	58
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	44	37	1703	1359	1298	1084	109	2600	3154	2600	554

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක. DMS/SM/02 හා 2020.09.04, 2020.09.18 හා 2020.11.02 හා 2021.04.30 දිනැති ලිපි මඟින් කාර්ය මණ්ඩලය අනුමත කර ඇති අතර, ඒ අනුව ඉහත වගුවේ ‘‘අනුමත සංඛ්‍යාව’’ සම්පූර්ණ කර ඇත.

එහෙත් අනුමත ප්‍රමාණයට වඩා අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සිටින බැවින්, දැනට සිටින හා යෝජිත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා මාගේ අංක. SMS/ADM/1/2/1-2019 හා 2020.12.03 දිනැති ලිපියෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, ඒ අනුව ‘‘සේවා නියුක්ත සංඛ්‍යාව’’ සම්පූර්ණ කර ඇත. 2021.01.19, 2021.02.11 හා 2021.08.02 දිනැති ලිපි මඟින් කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් නැවත ඉල්ලීම් කර ඇත.

6.3 මානව සම්පත් ධාරිතා සංවර්ධනය

	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
				දේශීය	විදේශීය		
1	කොළඹ විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලබන ප්‍රාදේශීය සංවර්ධන හා සැලසුම්කරණය පිළිබඳ එක් අවුරුදු පශ්චාත් උපාධි පාඨමාලාව - 2021/2021	3	වර්ෂ 1 සති අන්ත (පෙ.ව. 9.00 - ප.ව. 5.00)	450,000.00		දේශීය	ප්‍රාදේශීය සංවර්ධනය හා සැලසුම්කරණයපිළිබඳ පුළුල් දැනුමක්ලැබීම හා සිය සේවා ව්‍යවස්ථාව අනුව පළමු පංතියට උසස් වීමක් අත් කර ගැනීමට අවස්ථාවක් එළැඹීම.
2	වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය අළුත් කර ගැනීම		මාස 03 (පැය 18 බැගින්) (පෙ.ව. 9.00 - ප.ව. 4.00)	16,000.00			
3	කණ්ඩායම් 04 ක් සඳහා පවත්වන ලද ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව	70	මාස 03 (පැය 18 බැගින්) (පෙ.ව. 9.00 - ප.ව. 4.00)	144,000.00		දේශීය	ආයතනය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් රාජකාරි ඉටු කිරීමේ හැකියාව වර්ධනය වීම හා විශ්වසනීය හා කාර්යක්ෂම ලෙස සිය සේවය ඵලදායි ලෙස ලබා දීමට හැකි වීම.
4	ආකල්ප සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන	35	පැය 02 (පෙ.ව. 9.30 - ප.ව. 11.30	2,100.00		දේශීය	ආකල්ප වර්ධන තුළින් ආයතනය තුළ සිය සේවය කාර්යක්ෂමව හා ඵලදායිව ලබා දීම සඳහා පෙළඹවීමක් ඇති වීම.
5	තොරතුරු කළමනාකරණ පද්ධති නිර්මාණය පිළිබඳ පුහුණු වැඩසටහන	15	දින 04 (පෙ.ව. 8.30 - ප.ව. 4.30)	30,155.00		දේශීය	ලබා ගත් දැනුම භාවිතයෙන් එක් එක් අංශ සඳහා දත්ත පද්ධති නිර්මාණ කර ගැනීමෙන් ඒ ඒ අංශවල කාර්යාක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ යෑම.
6	ද්විතීයික ගණයේ නිලධාරීන් සඳහා පවත්වන ලද පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව	100	පැය 150 (පෙ.ව. 9.00 - මධ්‍යාහ්න්‍ය. 12.00 හා ප.ව. 2.00 - ප.ව. 5.00) සතියකට දින 03 බැගින් දින 25 ක්	0.00		දේශීය	රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම සම්පූර්ණ වීම හා වැටුප් වර්ධක හා උසස් වීම් ලැබීම තුළින් කාර්යක්ෂම සේවාවක් ඉටු වීම
7	නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම පිළිබඳ එක්දිනවැඩමුළුව	1	දින 01 (පෙ.ව. 8.30 - ප.ව. 4.30)	4,000.00		දේශීය	නිවාඩු භාර නිලධාරියාගේ දැනුම වර්ධනය වීම තුළින් සිය සේවාව විශ්වසනීය, කාර්යක්ෂමව හා ඵලදායිව ලබා දීමට හැකි වීම.

	වැඩසටහනේ නම	පුහුණු කරන ලද	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ ලබා ගත් දැනුම*
8	රජයේ වාහන නඩත්තුව පිළිබඳ එක්දින මාර්ගගත වැඩමුළුව	1	දින 01 (පෙ.ව. 8.30 - ප.ව. 4.30)	5,000.00		දේශීය	විෂය භාර නිලධාරියාගේ දැනුම වර්ධනය වීම තුළින් සිය සේවාව විශ්වසනීය, කාර්යක්ෂමව හා ඵලදායිව ලබා දීමට හැකි වීම.
9	සුව කිරීම සඳහා වලන ප්‍රතිකාරය පිළිබඳ උපදේශන වැඩසටහන	61	පැය 02 (පෙ.ව. 10.00 - මධ්‍යාහ්න 12.00)	6,900.00		දේශීය	ආකල්ප වර්ධනය තුළින් ආයතනය තුළ සිය සේවය කාර්යක්ෂමව හා ඵලදායිව ලබා දීම සඳහා පෙළඹවීමක් ඇති වීම.
10	දෙදින (එක්සෙල්) පරිගණක පුහුණු වැඩමුළුව	5	දින 02 (පෙ.ව. 9.00 - ප.ව. 4.00)	60,000.00		දේශීය	ලබාගත් පරිගණක දැනුම භාවිතයෙන් සිය සේවාව විශ්වසනීය, කාර්යක්ෂමව හා ඵලදායිව ලබා දීමට හැකි වීම.
		291		**718,155.00**	**-**		

මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතන වෙත පැවරී ඇති කාර්යභාරයන් අතර ප්‍රමුඛතම කාර්යය වන්නේ දිවයිනේ ආර්ථික,සමාජයීය, සෞඛ්‍යමය කායිකහා මානසික වශයෙන් පසුගාමී තත්ත්වයෙන් පසුවන ආන්තරීකරණයට ලක්වූ හා අවාසි සහගත තත්ත්වයන්හී දිවි ගෙවන ජන කණ්ඩායම් ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා අධ්‍යාත්මික වශයෙන් සවිබලගන්වා ඔවුන් හට ඉහළ ජීවන තත්ත්වයක් අත් කර දීමට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීමයි.

මෙම කාර්ය භාරය සාක්ෂාත් කර ගැනීම පිණිස මෙම අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන සතු මානව සම්පත් විෂයානුබද්ධ හා තාක්ෂණික දැනුමෙන් බලගැන්විය යුතු අතර ඊට සමාන්තරව සිය වගකීම් නිසියාකාරව ඉටු කිරීමට පෙළඹවීම සඳහා නිසි මග පෙන්වීම් සහිත ආකල්ප වර්ධන වැඩසටහන් වලට නිරන්තරයෙන් යොමු කළ යුතුය.

එම අරමුණු පෙරදැරිව ක්‍රියාත්මක කරන ලද ඉහත සඳහන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සිය දිවි පෙවෙත් පවත්වා ගෙන යාම පිණිස නිරතුරුවම අනවරත අරගලයක යෙදී සිටින යටකී අසරණ ජන කණ්ඩායම් හට දයානුකම්පිත සේවයක් සැලසීම සඳහා නිලධාරීන් තුළ මානසික අභිප්‍රේරණයක් ඇති වන අතර අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්ය සාධනය ඉහළ නැවීම උදෙසා එමගින් විශාල දායකත්වයක් සපයනු ලබයි.

පරිච්ඡේදය 07 – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීන කර	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	පවත්වාගෙන යාම			
2.8	තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාල නොවේ		
2.10	බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛණය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/204 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිලිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිලිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ඇතැම් විගණන විමසුම් සඳහා පිලිතුරු මසක් ඇතුළත සපයා නොමැත	මසක් ඇතුළත පිළිතුරු ලබා දෙන ලෙස අදාළ අංශ දැනුවත් කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණවිගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණනවාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	රටේ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් 2020.02.27 පළමු කාර්තුව සඳහාත් 2020.12.21 සිව්වන කාර්තුව සඳහාත් පමණක් රැස්වීම් පැවැත්වීමට හැකිවිය.	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයට අයත් එක් රථයක් අපහරණය කිරීමට ඇත.එය අපහරණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී	අපහරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින්	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අංක 2194/74 හා 2020.09.25 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් මෙම අමාත්‍යාංශය	දැනට සිටින කාර්ය මණ්ඩලයද ඇතුලත්ව යෝජිත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
			සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය බවට පත් වූ අතර, ඒ සඳහා අනුමත වූ කාර්ය මණ්ඩලය 60ක් විය. 2021.12.31 දිනට සිටින කාර්ය මණ්ඩලය 368 ක් විය.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය අනුමත වී නොමැති බැවිනි.	කාර්ය මණ්ඩලය අනුමත කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛණයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටී.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.	2022 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		